

# SOGIESC

# සම්බන්ධ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ අපරාධ ආමන්ත්‍රණය කිරීම

## මොඩියුලය 04

විවිධ SOGIESC පුද්ගලයින්ට එරෙහි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ අපරාධ ආමන්ත්‍රණය කිරීම

## හැඳින්වීම

මෙම මාර්ගෝපදේශන මාලාව ඇතුලත් මොඩියුල 4න් අවසාන මොඩියුලය මෙය වේ. මෙම මොඩියුලය මූලික අයිතිවාසිකම් (FR) උල්ලංඝණය වීම් සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයන් සහ සාපරාධී වරදකට මුහුණ දුන් විට සහන ලබා ගැනීම සඳහා වන යාන්ත්‍රණයන් කෙරෙහි අවධානය යොමු කරයි.

සාපරාධී වැරදි සඳහා වන විසඳුම් යාන්ත්‍රණයන් යටතේ, ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය, පැමිණිලි කිරිමේ පටිපාටිය සහ සමථකරණය සාකච්ඡා කෙරේ. FR උල්ලංඝණය කිරීම් සඳහා වන සහන යාන්ත්‍රණයන් යටතේ, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් සහන ලබා ගැනීම සහ HRCSL සහ ඔම්බුඩ්ස්මන් වෙත අයදුම් කිරීම සාකච්ඡා කෙරේ. එසේම මෙම මොඩියුලය අත්අඩංගුවේ සිටින හෝ රඳවා තබාගෙන සිටින පුද්ගලයෙකුගේ අයිතිවාසිකම් පිළිබඳවද සාකච්ඡා කරයි.

මෙම මොඩියුලයේ සඳහන් අන්තර්ගතය බෙදා හැරීමේ මාධ්‍යයන් ලෙස PPT slides භාවිතා කරමින් දේශනයන්, සාකච්ඡා සහ භූමිකා රංගනයන් භාවිතා කරයි.

මෙම මොඩියුලය පැය 6 කින් සිදු කිරීමට සැසි 5කින් සමන්විත යුතු වේ.



## අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කරන්න:

මොඩියුල 04 සහ අනෙකුත් ලියකියවිලි සඳහා අන්තර්ජාල ගත මාර්ග ඔස්සේ ප්‍රවේශ වීමට, පහත QR කේතය ස්කෑන් කරන්න:

නැතහොත් ඔබගේ වෙබ් බ්‍රවුසරයේ පහත URL එක ටයිප් කර පිවිසෙන්න:

**www.shorturl.at/qtP18**

## සැසිවල සැලැස්ම

### වේලාව පෙ.ව. 09.00 - ප.ව. 05.00 (පැය 6)

| ආරම්භ කරන වේලාව | වෙන් කර ඇති කාලය | සැසිය |
|---|---|---|
| **පෙ.ව. 09:00** | මිනිත්තු 15 | තෙවන දිනය පිළිබඳ ආවර්ජනය |
| **පෙ.ව. 09:15** | පැය 01 | පළමු සැසිය: පොදු අපරාධයක් සහ මානව හිමිකම් උල්ලංඝණයක් අතර වෙනස<br>*ක්‍රියාකාරකම් සහ සාකච්ඡාව* |
| **පෙ.ව. 10.15** | පැය 01 | දෙවන සැසිය: අපරාධ වැරදි සඳහා වන පිළියම්<br>*PPT Slides ආධාරයෙන් දේශනය* |
| **පෙ.ව. 11.15** | මිනිත්තු 15 | විවේකය |
| **පෙ.ව. 11.30** | පැය 01 | තෙවන සැසිය: මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සඳහා වන පිළියම්<br>*PPT Slides ආධාරයෙන් දේශනය* |
| **ප.ව. 12:30** | පැය 01 | දිවා විවේකය |
| **ප.ව. 01:30** | මිනිත්තු 45 | හතරවන සැසිය: අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීමේදී අයිතිවාසිකම්<br>*සාකච්ඡාව* |
| **ප.ව. 02:15** | පැය 1 මිනිත්තු 30 | පස්වන සැසිය: සාපරාධී වරදකට හෝ මානව හිමිකම් උල්ලංඝණයක් සඳහා වන ප්‍රායෝගික ප්‍රතිකර්ම<br>*භූමිකා රංගනය* |
| **ප.ව. 03:45** | මිනිත්තු 15 | විවේකය |
| **ප.ව 04.00** | මිනිත්තු 30 | පස්වන සැසිය |
| **ප.ව 04:30** | මිනිත්තු 15 | පශ්චාත් ඇගයීම |
| **ප.ව 04:45** | මිනිත්තු 15 | අවසානය සහ අදහස් ප්‍රකාශ කිරීම |

# පළමු සැසිය: පොදු අපරාධයක් සහ මානව හිමිකම් උල්ලංඝණයක් අතර වෙනස

***සාකච්ඡාවකින් අනතුරුව ක්‍රියාකාරකමකි***

## කාලය
පැය 1 යි

## ඉලක්ක කණ්ඩායම
සියලුම කණ්ඩායම්
කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගිවන්නන් 30කි.

## අරමුණු
මෙම සැසිය අවසානයේ,

- සාමාන්‍ය අපරාධයක් සහ මානව හිමිකම් කඩකිරීමක් අතර වෙනස හඳුනාගැනීමට සහභාගීවන්නන් හට හැකි වනු ඇත.

## අවශ්‍ය මෙවලම්

- මෙම සැසි සැලැස්ම අවසානයේ ඇති ඇමුණුම් වල මුද්‍රිත පත්‍රිකා.

## සකස් කිරීම

- PPT SLIDES

## පියවර

- මෙම සැසියේදී අපරාධයක් සහ මානව හිමිකම් කඩකිරීමක් අතර වෙනස ඉගෙන ගන්නා බව සහභාගිවන්නන්ට පැහැදිලි කරන්න.
- සහභාගිවන්නන් කණ්ඩායම් 5 කට බෙදන්න.
- එක් කණ්ඩායමකට එක් සිදුවීමක් බැගින් ලබාදෙමින්, කණ්ඩායම් අතර විවිධ සිද්ධි ඇතුලත් මුද්‍රණ පිටපත් බෙදා හරින්න (සැසි සැලැස්ම අවසානයේ ඇති ඇමුණුමේ දක්නට ලැබේ).
- ලබා දී ඇති සිදුවීම සාමාන්‍ය අපරාධයක්ද මානව හිමිකම් කඩවීමක්ද යන්න සාකච්ඡා කිරීමට කණ්ඩායම්වලට විනාඩි 20ක කාලයක් ලබා දෙන්න. මිනිත්තු 20 අවසානයේදී, එක් එක් කණ්ඩායමට සිද්ධිය පැහැදිලි කිරීමට ආරාධනා කරන්න සහ ඔවුන් එම සිද්ධිය සාමාන්‍ය අපරාධයක් හෝ මානව හිමිකම් උල්ලංඝණය කිරීමක් ලෙස නිගමනය කළේ ඇයි දැයි විමසන්න.
- එක් කණ්ඩායමට අවම වශයෙන් එක් වරක්වත් සහභාගී වී මෙම සිදුවීම්වල ප්‍රධාන අංග හඳුනා ගැනීමට සලස්වන්න.
- එක් කණ්ඩායමක ඉදිරිපත් කිරීමෙන් පසුව, එම සිදුවීම පොදු අපරාධයක් හෝ මානව හිමිකම් උල්ලංඝණය කිරීමක් බවට පත් කරන ප්‍රධාන ලක්ෂණ සාරාංශගත කරන්න.
- PPT Slides ආධාරයෙන් දේශනය ඉදිරියට පවත්වාගෙන යන්න. දේශනය සඳහා වූ සටහන් පහත 'සටහන්' කොටසේ දක්නට ලැබේ.

සටහන්

## සාමාන්‍ය අපරාධයක් සහ මානව හිමිකමක් අතර වෙනස්කම්

**සාමාන්‍ය අපරාධ**

අපරාධ යුක්ති පද්ධතිය යනු සාමාන්‍ය අපරාධ පිළිබඳ සිදුවීම් ආමන්ත්‍රණය කිරීම සඳහා රජය සතු මෙවලමකි. රාජ්‍යයේ මූලිකම කර්තව්‍යය වන්නේ එහි පුරවැසියන්ට ආරක්ෂාව සැපයීම වන අතර අපරාධ යුක්ති පද්ධතිය මෙයට පහසුකම් සපයයි.

අපරාධමය ක්‍රියාවන් පහත සඳහන් මූලාශ්‍රයන්හි දක්වා ඇත:

- දණ්ඩ නීති සංග්‍රහය (අපරාධ සහ අපරාධමය වැරදි සහ ඒවාට දඬුවම් නියම කරයි)
- අපරාධ නඩු විධාන සංග්‍රහය (දණ්ඩ නීති සංග්‍රහයේ දක්වා ඇති සාපරාධී නීතිය පරිපාලනය කිරීමේ ක්‍රියා පටිපාටිය දක්වා ඇත)

අපරාධ නීතිය සාමාන්‍යයෙන් සමාජයේ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම්, විශේෂිත අපරාධවල මූලද්‍රව්‍ය සහ විවිධ අපරාධ විත්තිවාචකයන්හි මූලිකාංග නිර්වචනය කරයි. අපරාධ නඩු විධාන සංග්‍රහය යනු සාමාන්‍යයෙන් අපරාධ ක්‍රියාවලියේදී පුද්ගලයන්ගේ අයිතිවාසිකම් බලාත්මක කිරීමයි, උදාහරණ ලෙස, නීතිය බලාත්මක කිරීමේ විමර්ශනය අතරතුර, අත්අඩංගුවට ගැනීමේදී, චෝදනා ගොනු කිරීමේදී, නඩු විභාගය අතරතුර සහ අභියාචනය අතරතුර යනාදිය.

ඔබ සාපරාධී වරදකට ලක්වුවහොත්, පළමු පියවර වන්නේ පොලිසියට පැමිණිල්ලක් කිරීමයි. සියලුම අපරාධයන් සඳහා රජය විසින් නඩු පවරනු ලැබේ- එයින් අදහස් වන්නේ ඔබට එරෙහිව අපරාධයක් සිදුවී ඇත්නම් නීතිඥයෙකු සොයා ගැනීමට සහ නීති ගාස්තු ගෙවීමට ඔබට අවශ්‍ය නොවන බවයි. එය රාජ්‍යයේ යුතුකමකි. පොලිසිය සහ නීතිපති දෙපාර්තමේන්තුව එක්ව අපරාධ නඩුවක් විභාග කරනු ඇත.

**මානව හිමිකම්**

මානව හිමිකම් රාජ්‍යය මත රඳා නොපවතින අතර, වෙනත් කිසිදු සාධකයක බලපෑමකින් තොරව සෑම පුද්ගලයෙකුටම හිමිවේ. ඒවා මනුෂ්‍යයෙකු වූ පමණින් පුද්ගලයෙකුට නෛසර්ගිකව හිමිවන අහිමි කළ නොහැකි අයිතිවාසිකම් වේ. මානව හිමිකම්වල අරමුණ රාජ්‍ය බලයෙන් පුද්ගලයා ආරක්ෂා කිරීමයි. ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් සම්මත කර ගැනීමෙන් මෙම ආරක්ෂාව නීත්‍යානුකූලව වඩාත් ඵලදායී වී ඇත.

ලංකාව තුළ මානව හිමිකම් ආරක්‍ෂා වන්නේ ජාතික ව්‍යවස්ථාපිත නීතිය වැඩි දියුණු කිරීමෙනි. එනම්, අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සපයා ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමකදී ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් හෝ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කිරීමේ යාන්ත්‍රණය හරහා සහනයක් ලබා ගත හැක.

**ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන්**

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) යනු විශ්වීය වශයෙන් ආරක්‍ෂා කළ යුතු මූලික මානව අයිතිවාසිකම් පිළිබඳව වන පළමු නීතිමය ලියවිල්ලයි. UDHR හි දක්වා ඇති අයිතිවාසිකම්වලට ඇතුළත් වන්නේ:

- 3 වන වගන්තිය - ජීවත්වීමේ අයිතිය

සෑම කෙනෙකුටම ජීවත්වීමේ අයිතිය, නිදහස සහ පුද්ගලයාගේ ආරක්ෂාව හිමිවී ඇත.

- 7 වැනි වගන්තිය - සමානාත්මතාවයට ඇති අයිතිය

නීතිය ඉදිරියේ සියලු දෙනාම සමාන වන අතර නීතියේ සමාන ආරක්ෂාව කිසිදු භේදයකින් තොරව හිමිව ඇත. මෙම ප්‍රකාශය උල්ලංඝණය කරමින් සිදුවන ඕනෑම වෙනස් කොට සැලකීමකට එරෙහිව සහ එවැනි වෙනස්කම් කිරීමට පෙළඹවීමකට එරෙහිව සැමට සමාන ආරක්ෂාවක් හිමි වේ.

- 9 වැනි වගන්තිය - අත්තනෝමතික අත් අඩංගුවට ගැනීමෙන් නිදහස් වීමේ අයිතිය

කිසිවකු අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමට, රඳවා තබා ගැනීමට හෝ පිටුවහල් කිරීමට යටත් නොකළ යුතුය.

- 12 වැනි වගන්තිය - පෞද්ගලිකත්වයට සහ පවුල් ජීවිතයට ඇති අයිතිය

කිසිවකු තම පෞද්ගලිකත්වයට, පවුලට, නිවසට හෝ ලිපි හුවමාරුවට අත්තනෝමතික ඇඟිලි ගැසීම්වලට හෝ ඔහුගේ ගෞරවයට හා කීර්තියට පහර දීමට යටත් නොවිය යුතුය. එවැනි මැදිහත්වීම් හෝ පහරදීම්වලට එරෙහිව නීතියේ ආරක්ෂාව සඳහා සෑම කෙනෙකුටම අයිතියක් ඇත.

UDHR හි සඳහන් අයිතිවාසිකම් පහත සඳහන් සම්මුතීන් දෙකෙන් සමන්විත ජාත්‍යන්තර අයිතිවාසිකම් පනත් කෙටුම්පත මගින් තවදුරටත් විස්තාරනය කර ඇත.

- ICCPR - සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
- ICESCR - ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය

ඔබේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇත්නම්, ඔබ විසින් හෝ නීතිඥයෙකු මාර්ගයෙන් ඔබට පිළියමක් ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය. ඔබට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ (HRCSL) සහාය ද ලබාගත හැකිය. මානව හිමිකම් උල්ලංඝණය කිරීම සඳහා පිළියම් සෙවීම පිළිබඳව ඉදිරි සැසිවාරයන්හී සවිස්තරාත්මකව සාකච්ඡා කරනු ඇත.

### සාරාංශය

මානව හිමිකම් ජාත්‍යන්තර නීතියේ අර්ථ දක්වා ඇත. මූලික අයිතිවාසිකම් යනු ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය මඟින් සහතික කර ඇති සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් කිහිපයක් වේ. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 වැනි ව්‍යවස්ථාවේ ඇති 'රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම්' වල ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් ඇතුළත් ව ඇත. ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ බලාත්මක කළ නොහැකි අතර හුදෙක් එම මූලධර්ම නීති සම්පාදනයේ සහ භාවිතයේ ඇතුළත් කිරීමේ අභිප්‍රාය පිළිබිඹු කරයි.

මානව හිමිකම් වැදගත් වන්නේ , විශේෂයෙන් අපයෝජනයට, නොසලකා හැරීමට සහ හුදකලා වීමට මුහුණ දෙන අයට ආරක්ෂාව සපයන බැවිනි. මෙම අයිතිවාසිකම් අපට බලය ලබා දෙන අතර පොදු අධිකාරියකින් මන්දගාමී සැලකීම්වලට එරෙහිව අභියෝග කිරීමට සහ කතා කිරීමට හැකියාව ලැබේ.

## ඇමුණුම

1. මර්වින් යනු සංක්‍රාන්තික සමාජභාවී මානව හිමිකම් ක්‍රියාධරයෙකි. ඔහු තම පෙම්වතිය වන රොෂ්නි සමඟ ජීවත් වන්නේ පිලියන්දල ප්‍රදේශයේය. සමරිසි භීතිකාවට, ද්විරිසි භීතිකාවට හා සංක්‍රාන්ති භීතිකාවට එරෙහි ජාත්‍යන්තර දිනය වෙනුවෙන් පැවැත්වූ මාධ්‍ය හමුවකදී මර්වින්, නැගී එන තරුණ දේශපාලන කණ්ඩායමක් වන " One Country Movement" විවේචනය කලේ ඔවුන්ගේ අදහස් සංක්‍රාන්ති භීතික වන බැවිනි. එම කණ්ඩායමේ නියමුවා වන මාලන්, මර්වින්ගේ විශ්ව විද්‍යාලයේම සහෝදරයෙක් වූ අතර දිනක් මර්වින්ගේ නිවසට පැමිණ ඇති බැවින් මාලන්, මර්වින් ජීවත් වන ස්ථානය පිලිබඳ දැනුවත්ය. මර්වින්ගේ මෙම මාධ්‍ය සාකච්ඡාවෙන් කෝපයට පත් මාලන්, පසුදා මැරයන් පිරිසක් මර්වින්ගේ නිවසට එවන ලද අතර, එහිදී එම මැරයන් විසින් රොෂිනීට පහර දී ලිංගික අතවර සිදු කර ඇත. එමෙන්ම මර්වින්ගේ පරිඝනකයේ මුරපදයද (password) බලහත්කාරයෙන් ලබා ගෙන එය රැගෙන යාමට උත්සාහ කර ඇත.

2. සරත් යනු තනිව ජීවත් වන සමරිසි පිරිමියකු වන අතර ඔහුට වයස අවුරුදු 70කි. දිනක් අමල් හා කමල් යන තරුණයන් දෙදෙනෙකු ඔහුගේ නිවස බිඳ වටිනා ඔරලෝසුවක් සොරාගෙන ඇත. පසුව මේ සම්බන්ධයෙන් සරත් පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කරන අතර, පසුවදාම පොලිසිය විසින් මෙසේ නිවස බිඳ දැමූ පුද්ගලයින් දෙදෙනා පොලිස් ස්ථානයට කැඳවනු ලබයි. කමල්ගේ වැඩිමල් සහෝදරයා පොලිස් ස්ථානාධිපතිවරයාගේ මිතුරෙකු වන අතර, ඔහු ස්ථානාධිපතිවරයා අමතා තම සහෝදරයා ගැටලුවකට මුහුණ පා ඇති බවත් එය විසඳා දෙන ලෙසත් පවසා ඇත. පසුව මොවුන් දෙදෙනා පොලිස් ස්ථානයේදී පවසන්නේ සරත් ඔවුන්ට නිවසට ආරාධනා කල බවත් එසේ සිදු කර ලිංගික අතවර සිදු කල බවත්ය. එහිදී ඔවුන් දෙදෙනා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර නැවත පැමිණියා මිසක නිවසින් කිසිදු දෙයක් ලබා නොගත් බවට ප්‍රකාශ කර ඇත. පොලීසිය මෙම පුද්ගලයින් ප්‍රකාශ කරනා දෙය සත්‍යයක් බවට පිළිගන්නා අතර, සරත්ගේ පැමිණිල්ල සටහන් කර ගැනීම ඔවුන් ප්‍රතික්ෂේප කලහ.

3. සවනි කොළඹ පිහිටි අධ්‍යාපන අමාත්‍යංශයේ සේවය කරයි. ඇය සමරිසි, වයස අවුරුදු 40ක පුද්ගලයෙක් වන අතර ඇය තම දෙමව්පියන් සමඟ ජීවත් වේ. කෙතරම් වෙහෙස වී රැකියාව කල ද ඇයට උසස්වීම් ලැබුනේ නැත. මීළඟ උසස්වීම තමාට වුවත්, ඒ සම්බන්ධයෙන් ඇයව නොසලකා හරින බව ඇය සොයා ගනී. ඇය තම සුපරීක්ෂක වන මාලිනී ගෙන් තමාගේ උසස් කිරීම නොසලකා හරින්නේ ඇයි දැයි විමසීය. එහිදී ඇය, සවනි සමරිසි පුද්ගලයෙක් නිසාවෙන් ඇය වැනි කෙනෙකුට උසස් වීමක් ලබා දීම තුලින් දෙපාර්තමේන්තුවට අගෞරවයක් බවට පැහැදිලි කරයි.

4. ෂෝන් යනු ශ්‍රී ලංකාවේ රජයේ පාසලක 14 හැවිරිදි සිසුවෙකි. ඔහු පන්තියේ මිතුරෙකු වන රේමන් කෙරෙහි ඇල්මක් දක්වයි. දවසක් ෂෝන් රේමන්ට ආදර ලිපියක් ලියන අතර එය පාසල් ගුරුවරයාට හමු වේ. ගුරුවරයා එය විදුහල්පතිවරයාට ලබා දෙයි. විදුහල්පතිවරයා ෂෝන්ගේ දෙමාපියන් පාසලට කැඳවා ඔහුව පාසලෙන් ඉවත් කරන ලෙස ඉල්ලා සිටියි. ෂෝන්ගේ මව නීතිඥවරියක් වන අතර ඇය ෂෝන්ව පාසලෙන් පිටතට ගෙන යාමට කැමති නැත. ඇත්ත වශයෙන්ම, මෙය FR උල්ලංඝණය කිරීමක් යැයි ඇය සිතන අතර පියවර ගැනීමට යයි.

5. ජෙනෙල් තරුණ සංක්‍රාන්තික සමාජභාවී කාන්තාවකි. දිනක් ඇය රැකියාවට යන අතරතුර සාමාන්‍ය පොලිස් මුරපොලකදී ඇයගේ වාහනය පොලිස් නිලධාරින් විසින් නතර කරයි. එවිට ඇයගේ රියදුරු බලපත්‍රයේ ඇයගේ නම ජේසන් ලෙසත්, පුරුෂ ලිංග ලෙසත් සඳහන් කර ඇති බව දකින පොලිස් නිලධාරින් ඇය වෙනත් අයෙකු ලෙස පෙනී සිටිමින් වංචා කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනී. ඇයව පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය පසු නිලධාරින් දෙදෙනෙක් විසින් ඇය සමාජයට තර්ජනයක් බව ප්‍රකාශ කරමින් තර්ජනය කරන අතර, එහි සිටි තවත් නිලධාරියෙක් ඇගේ පියයුරු ස්පර්ශ කරමින් ඒවා ඇත්ත ද යන්න තහවුරු කර ගැනීමට උත්සාහ කර ඇත.

# දෙවන සැසිය : අපරාධ වැරදි සඳහා වන පිළියම්

***PPT Slides* ආධාරයෙන් දේශනය**

**කාලය**

පැය 1යි

**ඉලක්ක කණ්ඩායම**

සියලුම කණ්ඩායම්

කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගිවන්නන් 30 කි

**මෙම සැසිය අවසානයේ,**

- ඔවුන් අපරාධමය වරදකට මුහුණ දුන් විට අනුගමනය කළ යුතු ක්‍රියාවලිය පිළිබඳව,
- ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය පිළිබඳ මූලික කරුණු පිළිබඳව,
- සමථකරණය පිළිබඳ මූලික කරුණු

යනාදිය පිලිබඳව සහභාගිවන්නන් හට අදහසක් ලබාගැනීමට හැකි වනු ඇත.

**අවශ්‍ය මෙවලම්**

- ප්‍රොජෙක්ටරය හා තිරය

**සකස් කිරීම**

- PPT Slides

**පියවර**


- මෙම සැසියේදී, සහභාගිවන්නන් අපරාධමය වරදක් සම්බන්ධයෙන් පිළියම් ලබා ගත හැකි ප්‍රධාන ක්‍රම දෙකක් ඉගෙන ගන්නා බව පැහැදිලි කරන්න: 1) අධිකරණ පිළියමක් වෙත ප්‍රවේශ වීම සහ 2) සමථකරණය.
- PPT Slides ආධාරයෙන් දේශන ඉදිරියට කරගෙන යන්න.
- ඉදිරිපත් කිරීම අතරතුර, සහභාගිවන්නන්ට ප්‍රශ්න ඇසීමට කාලය ලබා දෙන්න.
- සහභාගිවන්නන් සම්බන්ධ කර ගැනීමට ප්‍රශ්න භාවිතා කරන්න; උදාහරණයක් ලෙස, 'ඔබ පැමිණිල්ලක් කිරීමට පොලිස් ස්ථානයට යන විට ඔබ රැගෙන යා යුත්තේ මොනවාද?', ' සමථකරණයට යොමු නොකළ යුතු නඩු තිබේ යැයි ඔබ සිතනවාද?', අපරාධවලට ගොදුරු වූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට 'රජය විසින් කල යුත්තේ මොනවාද?'
- ඉදිරිපත් කිරීම සඳහා සටහන්, පහත 'සටහන්' කොටසින් සොයා ගත හැක.

## සටහන්

### අපරාධ සඳහා පිළියමක්: අධිකරණ මය පිළියම් වෙත ප්‍රවේශ වීම

ශ්‍රී ලංකාවේදී ඔබ සාපරාධී වරදකට ලක්වුවහොත් ඔබට අධිකරණ පද්ධතිය හරහා පිළියම් සෙවිය හැක.

### ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය




ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ධුරාවලිය 1978 අංක 2 දරන අධිකරණ පනතේ 2 වැනි වගන්තියේ දක්වා ඇත. ප්‍රාථමික අධිකරණ, මහේස්ත්‍රාත් උසාවි, දිස්ත්‍රික් උසාවි සහ මහාධිකරණ යනු ප්‍රථම අවස්ථා උසාවි බව මෙම නීත්‍යානුකූල ධුරාවලියෙන් දක්වා ඇති අතර සීමිත සහ විශේෂිත සිද්ධීන් සඳහා අභියාචනය සහ සමාලෝචන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම මහාධිකරණ මඟින් සිදු වේ. අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය යනු අභියාචනා ඉදිරිපත් කල හැකි අධිකරණ වේ.

අපරාධ නීතිය සම්බන්ධ නඩු වලදී, ප්‍රාථමික මට්ටමේ අධිකරණ බලය ඇති එකම අධිකරණය මහේස්ත්‍රාත් අධිකරණයක් හෝ මහාධිකරණයක් වේ; අපරාධ නඩු විධාන සංග්‍රහයේ ඊට අදාළ නීතිමය බලයන් සපයා ඇත.
බොහෝ අපරාධ නඩු විභාග ආරම්භ වන්නේ මහේස්ත්‍රාත් අධිකරණයකය. මෙම නඩු ඕනෑම පොලිස් නිලධාරියෙකු විසින් හෝ රජයේ සේවකයෙකු විසින් මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත හෝ වාචික පැමිණිල්ලක් මඟින් ආරම්භ කළ හැක. මිනීමැරුම් නඩු විභාග සහ රජයට එරෙහි විවිධ වැරදි සම්බන්ධයෙන් නඩු කටයුතු ආරම්භ කරන්නේ මහාධිකරණය මඟින් ය .බොහෝ සිවිල් කටයුතු සම්බන්ධයෙන් මුල් අධිකරණ බලය අදාළ දිස්ත්‍රික් අධිකරණය සතුය.

අභියාචනාධිකරණය යනු සියලුම මුල් උසාවිවල තීරණ සම්බන්ධයෙන් සත්‍ය හෝ නීතියේ සියලු දෝෂ නිවැරදි කිරීම සඳහා වන පළමු අභියාචනාධිකරණයයි. ඕනෑම නියෝගයක්, තීන්දුවක්, නියෝගයක් තහවුරු කිරීම, ආපසු හැරවීම, නිවැරදි කිරීම හෝ වෙනස් කිරීම සඳහා එහි අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී, අභියාචනාධිකරණය සුදුසු යැයි හැඟෙන පරිදි පළමු අවස්ථා අධිකරණයකට, විනිශ්චය සභාවකට හෝ වෙනත් ආයතනයකට උපදෙස් ලබා දිය හැකිය, නැතහොත් නව නඩු විභාගයක් හෝ අතිරේක නඩු ඇසීමක් නියම කළ හැකිය.
ශ්‍රේෂ්ඨාධිකරණය යනු ඉහළම සහ අවසානයට වාර්තා කරන උසාවිය වන අතර ශ්‍රේෂ්ඨාධිකරණ මඟින් අවසාන සිවිල් සහ අපරාධ අභියාචනා අධිකරණ බලය ක්‍රියාත්මක කරයි. එසේම ශ්‍රේෂ්ඨාධිකරණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ මූලික අයිතිවාසිකම්වලට එරෙහිව විධායක සහ ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීමේ අධිකරණ බලයද ක්‍රියාත්මක කරයි.
වැඩිදුර කියවීම :https://roar.media/english/life/reports/cogs-of-democracy-sri-lankas-court-system

### අපරාධ වරදක් සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම

ශ්‍රී ලංකාව තුළ, ඔබ SOGIESC මත පදනම් වූ ද්වේශ සහගත අපරාධයක් ඇතුළු අපරාධමය වරදකට මුහුණ දුන්විට, පළමු පියවර වන්නේ පොලිසියට පැමිණිලි කිරීමයි. පොලිස් ස්ථානය සෑම දිනකම පැය 24 පුරාම විවෘතව පවතී.

SOGIESC පුද්ගලයන් ඇතුලත්ව සෑම පුද්ගලයෙකුටම ශ්‍රී ලංකා පොලිසියේ පැමිණිල්ලක් කිරීමට අයිතිය ඇත.

සාමාන්‍යයෙන් පැමිණිල්ල කළ යුත්තේ අපරාධය සිදු වූ ප්‍රදේශයේ අධිකරණ බලය ඇති පොලිස් ස්ථානයටය. (එනම් ඔබේ පැමිණිල්ල අපරාධය/උල්ලංඝනය සිදු වූ ප්‍රදේශයේ ළඟම ඇති පොලිස් ස්ථානයට කළ යුතුය).

පොලිස් ස්ථානයට පැමිණි පසු, පිළිගැනීමට සිටින නිලධාරියා සමඟ කතා කර ඔබේ පැමිණිල්ලේ ස්වභාවය පැහැදිලි කල යුතුය. OIC විසින් ඔබගේ පැමිණිල්ල අදාල අංශය වෙත යොමු කළ යුතුය (උදා: එය මංකොල්ලකෑම් පිළිබඳ පැමිණිල්ලක් නම්, ඔබව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ඇත.)

පැමිණිල්ල ඉදිරිපත් කරන විට, පහත සඳහන් දෑ සැපයිය යුතුය:

- ඔබව හඳුන්වා දෙන්න. (සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, වයස, රැකියාව, පදිංචිය, දුරකථන අංක)
- සිද්ධිය වූ වේලාව, දිනය, ස්ථානය
- චූදිතයන් විස්තර කරන්න (ඔබ සතු සෑම තොරතුරක්ම ලබාදෙන්න, විශේෂයෙන්ම, නම, සමාජභාවය, වයස, රැකියාව/තනතුර)
- චෝදනාව විස්තර කරන්න (උදා. ලිංගික හිංසනයක් නම්, කුමන ආකාරයේ හිංසනයක්ද, එය ලිංගික හිංසනයක් බවට ඔබ තේරුම් ගත්තේ ඔවුන් කුමක් කල නිසාද?)
- ඔබ සොයන පිළිසරණ කුමක්ද (උසාවියට යාමට, බේරුම් කිරීමට, වන්දි ලබාගැනීමට, ආදිය)

පැමිණිල්ලක් කිරීමෙන් පසු, ඔබේ පැමිණිල්ල භාර ගන්නා නිලධාරියාගෙන් පසු විපරම් කිරීම සඳහා උපදෙස් ලබා ගත යුතු අතර ඔවුන්ගේ උපදෙස් සටහන් කර ගත යුතුය. පැමිණිල්ලේ පිටපතක් සඳහා ඔබට හිමිකම් ඇත (උදා: අතුරුදහන් වූ ජාතික හැඳුනුම්පත, බලපත්‍රය ආදිය පිළිබඳව පැමිණිල්ලකදී).

- කිසිදු අනිසි ප්‍රමාදයකින් තොරව අනතුරු වාර්තාව නිකුත් කිරීමට ස්ථානාධිපතිවරයා බැඳී සිටී.
- එසේ නොමැතිනම්, පසුකාලීන නඩු විභාගයේ දිනකදී එය ව්‍යාජ සාක්ෂි ලෙස පොළඹවා ගත හැකි බැවින් ඔබට පිටපතක් ලබා නොදෙනු ඇත. (අපරාධ නඩු විධාන සංග්‍රහයේ 444 වගන්තිය)
- පැමිණිල්ලේ පිටපතක් සඳහා චූදිතයාට හිමිකමක් ඇත.

ශ්‍රී ලංකා පොලිසියට පුරවැසියන්ගේ පැමිණිලි ප්‍රතික්ෂේප කළ නොහැක. එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සිදුවුවහොත් සහකාර පොලිස් අධිකාරී (ASP) සමග හමුවීමක් ඉල්ලා සිටිය හැක.

**පොලිසියේ වැරදි සම්බන්ධව, ශ්‍රී ලංකා පොලිසියේ ක්‍රියාවන්ට එරෙහිව පැමිණිල්ලක් කිරීමට ඔබට අවශ්‍යනම්;**

- පොලිස් නිලධාරියෙකුගේ හෝ පොලිස් සේවයේ ක්‍රියාවකින් අගතියට පත් ඕනෑම තැනැත්තෙකුට මහජන පැමිණිලි විමර්ශන අංශයට (PCID) හෝ ජාතික පොලිස් කොමිසමේ ඕනෑම පළාත් කාර්යාලයකට පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැක.
- පළාත් කාර්යාලයට ලැබෙන මහජන පැමිණිලි පිළිබඳ විමර්ශන භාරව කටයුතු කළ යුතු පළාත් අධ්‍යක්ෂවරයකු සෑම පළාතකටම පත් කළ යුතුය. ඔහු කොමිසමේ PCID හි අධ්‍යක්ෂ වෙත සෘජුවම වාර්තා කළ යුතුය.
- පොලිස් නිලධාරියෙකුට හෝ පොලිස් සේවයට එරෙහිව ලැබෙන ඕනෑම මහජන පැමිණිල්ලක් සතියක් ඇතුළත බලය ලත් නිලධාරියෙකු විසින් පිළිගත යුතුය.

පැමිණිල්ලක් කිරීමට පොලිස් ස්ථානයට යන විට, ඔබ සමඟ නීති උපදෙස් ලබා ගැනීම සඳහා නීතිඥවරයෙකු කැටුව යාම සුදුසුය.

## ලිංගික ප්‍රචණ්ඩත්වය පිළබඳව පැමිණිලි කිරීම

ස්ත්‍රී දූෂණ ඇතුළු ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිල්ලක් කරන්නේ නම් හැකි ඉක්මනින් පොලිස් ස්ථානයට යෑම සුදුසුය. DNA ආරක්ෂා කිරීම සඳහා සහ ඔබට සිදුකල අපරාධයේ වෙනත් භෞතික සාක්ෂි ආරක්ෂා කර ගැනීම සඳහා දත් මැදීමෙන්, ස්නානය කිරීමෙන් හෝ ඔබේ ඇඳුම් මාරු කිරීමෙන් වලකින්න. යම් තුවාලයක් ඇත්නම්, පොලිසිය විසින් ඔබව රෝහලට ගෙන යනු ඇත.

වින්දිතයාගේ නඩුව සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම සඳහා පොලිසියට සාක්ෂි එකතු කිරීමට සිදුවේ. සාක්ෂි එකතුකිරීමට වෛද්‍ය පරීක්ෂණ, ඇඟිලි සලකුණු, DNA පරීක්ෂණ ආදිය ඇතුළත් වේ

වැඩි දුර කියවීමට:

https://gic.gov.lk/gic/index.php/en/component/info/?id=479&catid=31&task=info

## නීති ආධාර ලබා ගැනීම

රටක අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා නීතිමය සහය ලබාදීම යනු යුක්තිය පසිඳලීමේ වැදගත් කොටසකි.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව (LAC) ප්‍රධාන වශයෙන් එහි තිරසාරභාවය සහ ස්ථාවරත්වය හේතුවෙන් මෙම අවශ්‍යතාවය සපුරාලන විවිධ ආයතන සහ සංවිධාන අතර ප්‍රමුඛ වේ. නීති ආධාර කොමිෂන් සභාව 1978 අංක 27 දරණ පනත මගින් ස්ථාපිත කරන ලද අතර වර්තමානයේ එය සෘජුවම ප්‍රධාන කාර්යාලය යටතේ පිහිටා ඇති කොළඹ මධ්‍යස්ථානය ඇතුළුව දිවයින පුරා මධ්‍යස්ථාන 84කින් සමන්විත වේ.

1978 අංක 27 දරණ නීති ආධාර පනතේ සඳහන් වන්නේ කොමිෂන් සභාව විසින් රටේ සිටින සියලුම "සුදුසුකම් ඇති පුද්ගලයින්ට" නීති ආධාර සැපයීමට නියමිත බවයි. ප්‍රාදේශීය නීතිඥ සංගම්වලින් ස්ථිර නීති නිලධාරීන් 120කට අධික සංඛ්‍යාවක් සහ 1000කට අධික නීතිඥවරුන්ගෙන් සමන්විත නීති ආධාර කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ සාධාරණ යුක්තිය සඳහා ප්‍රවේශය සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන ආයතනය වේ.

නීති ආධාර කොමිෂන් සභාව රටේ ඕනෑම පුද්ගලයෙකුට ඔවුන්ගේ ආදායම් මට්ටම නොසලකා නොමිලේ නීති උපදෙස් ලබා දේ. නොමිලේ නීති උපදෙස් ඉල්ලා ඕනෑම පුද්ගලයෙකුට සතියේ දිනවල, පෙ.ව 8.30 සිට ප.ව 4.15 දක්වා LAC ප්‍රධාන කාර්යාලයට හෝ මධ්‍යස්ථාන වෙත පැමිණිය හැකිය.

කෙසේ වෙතත්, නීති ආධාර කොමිෂන් සභාවේ මධ්‍යස්ථානවල ප්‍රධාන අවධානය යොමු වන්නේ නඩු පැවරීමයි. සුදුසුකම් ඇති පුද්ගලයින්ට නීති ආධාර ලබා දෙනු ලැබේ: ' සුදුසුකම් ඇති පුද්ගලයා' යන යෙදුම නීතියේ අර්ථ දක්වා නොමැති අතර ජාත්‍යන්තරව පිළිගත් පරීක්ෂණ භාවිතා කරමින් LAC විසින් අර්ථකථනයක් ලබා දී ඇත -

මධ්‍යන පරීක්ෂණය: මධ්‍යන පරීක්ෂණය යටතේ 'සුදුසුකම් ඇති පුද්ගලයින්ට" වන්නේ මාසිකව රු. 25000.00 හෝ ඊට අඩු ආදායම් මට්ටමක් ඇති පුද්ගලයින්ටය. ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා විසින් ආදායම තහවුරු කළ යුතුය. සුදුසු අවස්ථාවන්හිදී, ආදායම් මට්ටම රු. 25000 ඉක්මවන අසරණ පුද්ගලයන්ට නීති ආධාර සැපයීමේදී නම්‍යශීලී වීමට සහ තමාගේ අභිමතය භාවිතා කිරීමට අදාළ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ හෝ නීති නිලධාරියාට හැකියාව ඇත.

මෙම සන්දර්භය තුළ පවුලක පියෙකුට රු. 25000.00 හෝ ඊට වැඩි ආදායමක් ඇති විට, පියාට මසකට රුපියල් 25000.00 හෝ ඊට වැඩි ආදායමක් තිබුණද පවුලේ බිරිඳට, පුතාට, දුවට හෝ පවුලේ වෙනත් ඕනෑම සාමාජිකයකුට නීති ආධාර ලබාගත හැකිය. නීති ආධාර ලබා දීමේදී සලකා බලන්නේ අදාල පුද්ගලයාගේ ආදායමයි.

යුක්තිය පරීක්ෂණය: නඩු විභාගයේ විෂය පථය, සමූහයකට හෝ පුලුල් පන්තියක පුද්ගලයන්ගේ පුද්ගලික ආරවුල් විනිශ්චයක් ඉක්මවා යන අවස්ථාවන්හීදී නීති ආධාර සැපයීමේදී යුක්තිය පරීක්ෂණය භාවිතා කරනු ලබයි.

නඩත්තු නඩු වලදී කාන්තාව සඳහා විශේෂිත තත්ත්වයක්: තම ආදායම/ මූල්‍ය තත්ත්වය නොසලකා තමන්ට සහ තම දරුවන්ට නඩත්තුව අපේක්ෂා කරන සියලුම කාන්තාවන්ට නීති ආධාර ලබා ගත හැක.

ක්‍රියාවලිය: ඔබ 'සුදුසුකම් ලත් පුද්ගලයෙක්' නම්, ඔබේ දුක්ගැනවිල්ල ප්‍රාදේශීය නීති ආධාර කාර්යාලයට දැනුම් දීමෙන් පසු, ඔබගේ ප්‍රශ්නය සඳහා නිලධාරියකු, බොහෝ විට නීතිඥයෙකු පත් කරනු ලැබේ. මෙම ප්‍රශ්නය සඳහා නඩු පැවරීමකට ගියහොත්, සියලුම අධිකරණ වියදම් නීති ආධාර කාර්යාලය විසින් දරනු ලබන අතර ඔවුන් ඔබ වෙනුවෙන් උසාවියේදී ඔබේ ප්‍රශ්නය නියෝජනය කරනු ඇත

### අපරාධවල වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම

2015 අංක 04 දරණ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත මගින් අපරාධවලට ගොදුරු වූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරියක් පිහිටුවීම සඳහා සහාය සපයයි. මෙම අධිකාරිය අංක 428/11A, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

" අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය " පිහිටුවීම සහ නඩත්තු කිරීම සඳහා මෙම පනත විධිවිධාන සලසා ඇත. මෙම පනතේ 19(2) වගන්තිය මගින් කොට්ඨාශය භාරව පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා සඳහා විධිවිධාන සලසා ඇත.

රාජ්‍යයක යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය නිසි ලෙස ක්‍රියාත්මක වීම රඳා පවතින්නේ වින්දිතයින් තමන්ට එරෙහිව සිදු වූ අපරාධ පිළිබඳව වාර්තා කිරීමට ඇති කැමැත්ත සහ සාක්ෂිකරුවන් සිටීම මත සහ ඔවුන් දුටු දේ පිළිබඳ පූර්ණ හා අපක්ෂපාතී තොරතුරු සැපයීම සහ සාක්ෂි දීම මත වන බැවින් මෙය වැදගත් සේවාවක් බව අවධාරණය කළ යුතුය. මෙම නිසා, වින්දිතයින්ට සහ සාක්ෂිකරුවන්ට තර්ජනයක් දැනෙන විට, ඔවුන්ගේ ඉදිරිපත් වීමේ කැමැත්ත සහ හැකියාව හැල්ලුවට ලක් කරන විට, සමස්තයක් වශයෙන් සමාජයට යුක්තිය අහිමි වේ.

### අධිකාරියේ රාජකාරි සහ කාර්යයන්;

පනතේ 11 වැනි වගන්තිය යටතේ ස්ථාපිත අධිකාරියේ රාජකාරි සහ කාර්යයන්:

- බලාත්මක කිරීමේ කාර්යයන්: අපරාධවලට ගොදුරු වූවන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් හඳුනා ගැනීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ දැනුවත් කිරීම;
- අර්ධ-අධිකරණ කාර්යයන්: අපරාධවලට ගොදුරු වූවන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීම සහ අධීක්ෂණය කිරීම සහ රාජ්‍ය ආයතන, රාජ්‍ය නිලධාරීන් සහ අධිකරණ වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;
- මෙහෙයුම් කාර්යයන්: අපරාධවලට ගොදුරු වූවන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම;
- නියාමන කාර්යයන්: මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ අධීක්ෂණය කිරීම.

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගෙන් හෝ වෙනත් බරපතළ අපරාධකරුවන්ගෙන් තර්ජන ඇති විය හැකි සාක්ෂිකරුවන්ට නව අනන්‍යතා සැපයීමේ යාන්ත්‍රණයක් තවමත් ශ්‍රී ලංකාවට නොමැත.

සාක්ෂිකරුවෙකු තම ආරක්ෂාවට ඇති බිය නිසා හඳුනාගැනීමේ පෙරට්ටුවකට සහභාගී නොවීමට තීරණය කරන්නේ නම්, පිටස්තර පුද්ගලයින් බොහෝමයකගේ අවධානයට ලක් නොවී සාක්ෂිකරුට වෙනම ස්ථානයක සිට විත්තිකරු හඳුනා ගැනීම සඳහා ප්‍රතිපාදන තිබේ.

### අපරාධ සඳහා පිළියම්: සමථකරණය

විකල්ප ආරවුල් නිරාකරණය (ADR) යනු බේරුම්කරණය, සමථකරණය හෝ සාකච්ඡා කිරීම වැනි නඩු වලින් තොරව ආරවුල් විසඳීමේ ක්‍රියා පටිපාටියකි. මේවා වඩාත් සාමදාන කිරීමට නැඹුරු වේ. ADR ක්‍රියා පටිපාටි සාමාන්‍යයෙන් අඩු වියදම් සහ වඩාත් වේගවත් වේ.

පාර්ශවයන් ADR ක්‍රියාදාමයන්ට නැඹුරු වන එක් මූලික හේතුවක් වන්නේ, නඩු පැවරීම් මෙන් නොව ADR ක්‍රියා පටිපාටි බොහෝ විට සහයෝගීතාවයෙන් යුක්ත වන අතර පාර්ශවයන්ට එකිනෙකාගේ ස්ථාවරයන් අවබෝධ කර ගැනීමට ඉඩ සැලසීම යි. උසාවියකට නීත්‍යානුකූලව පැනවීමට නොහැකි වඩාත් නිර්මාණාත්මක විසඳුම් ඉදිරිපත් කිරීමට ADR මඟින් පාර්ශවයන්ට ඉඩ සලසයි.

### සමථකරණය

සමථකරණය යනු ශ්‍රී ලංකාවේ භාවිතා වන විකල්ප ආරවුල් විසඳීමේ ආකාරයකි.

සමථ මණ්ඩල ස්ථාපිත කරන ලද 1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනත මඟින් ශ්‍රී ලංකාව තුළ සමථකරණය සිදු කළ යුතු ආකාරය ද දක්වා ඇත. ආරවුල ඇති පාර්ශ්වයන් විසින් මෙන්ම ඇතැම් අවස්ථාවල උසාවි මගින් යොමු කරනු ලබන සියලුම ආරවුල් සමථකරණ ක්‍රියාවලිය මගින් විසඳා ගැනීමට බලය ඇති සමථ මණ්ඩල ආයතනගත කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව පනත මගින් විධිවිධාන සලසා ඇත.

සමථ මණ්ඩල පිහිටුවීම මගින් සුළු ආරවුල් කඩිනමින් සමථයකට පත් කිරීම සඳහා සුවිශේෂී අවස්ථාවක් ලබා දී ඇති අතර, එය ආරවුල් විසඳීම සඳහා නඩු පැවරීමට විකල්ප මාධ්‍යයක් ලෙස ශක්තිමත් යාන්ත්‍රණයක් සේ ක්‍රියාත්මක වේ. මේ වන විට දිවයින පුරා සමථ මණ්ඩල 329ක් ක්‍රියාත්මක වන අතර ආසන්න වශයෙන් සමථකරුවන් 8266ක් ස්වේච්ඡා පදනමින් මිනිසුන්ට සහය වෙමින් වසර ගණනාවක් තිස්සේ ඇදී ගිය ඔවුන්ගේ ආරවුල්වලට සාමකාමී විසඳුමක් ලබා ගැනීමට සහාය වේ.

සමථ මණ්ඩල කොමිෂන් සභාව සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. ඔවුන්ගෙන් තිදෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරුන් විය යුතු බව ව්‍යවස්ථාපිතව සඳහන් කර ඇත. මෙම සියලුම සාමාජිකයන් පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. සමථ මණ්ඩල කමිටුවල පරිපාලන කටයුතු, එනම්. පත්කිරීම්, ස්ථාන මාරුවීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලනය සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් කරනු ලැබේ.

පාර්ශවයන් අතර ආරවුල් නිරාකරණයේදී තුන්වන පාර්ශවයක් ලෙස සමථකරුවන් ක්‍රියාකරයි. සමථ මණ්ඩල කමිටුවලට වසරකට ලැබෙන ආරවුල් සංඛ්‍යාව මත පදනම්ව එහි කාර්යක්ෂමතාවය ඇගයීමට ලක් කළ හැක.

ශ්‍රී ලංකාවේ නීතියට අනුව, රුපියල් 500000ට අඩු දේපළ හෝ ණය හිමිකම් වැනි ඇතැම් වැරදි සහ තුවාල කිරීම , බිය ගැන්වීම, අනවසරයෙන් ඇතුළුවීම සහ අයථා පරිහරණය වැනි සුළු අපරාධ වරදවල් උසාවියේදී විභාගයට ගැනීමට පෙර සමථකරණයට යොමු කිරීම අනිවාර්ය වේ. . සමථයකට නොපැමිණියේ නම්, අධිකරණයක් ඉදිරියේ නඩු විභාග කිරීම සඳහා මණ්ඩලය විසින් නිකුත් කරන ලද සමථයකට පත් නොවූ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

## සමථකරණයට යොමු කළ හැකි ආරවුල්

සමථකරණය සඳහා අනිවාර්යයෙන් යොමු කළ යුතු ආරවුල් (එවැනි ආරවුලක් සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් අධිකරණයේ ගොනු කිරීමට පෙර) සහ පාර්ශ්වයන්ගේ තෝරාගැනීම අනුව සමථකරණය සඳහා ස්වේච්ඡාවෙන් යොමු කළ හැකි වෙනත් ආරවුල් අතර වෙනස හඳුනා ගැනීමට පනත උත්සාහ කරයි. අධිකරණය විසින් ආරවුල් සමථකරණයට යොමු කිරීමටද විධිවිධාන ඇත.

ආරවුල් විසඳීමට පමණක් නොව ඒවා මඟහරවා ගැනීමටද සමථකරණයට හැකියාව ඇත. ස්ථාවර සමාජයක් සහ යහපත් ආර්ථික පරිසරයක් පවත්වාගෙන යාමට සමථකරණය උපකාරී වේ. ප්‍රජා, වාණිජ්‍ය සහ රැකියා ආරවුල් සමථකරණය තුළින් විසඳා ගැනීම මගින් ආරවුල් ඇති පාර්ශ්වයන්ට ගැටලුවලට තමන්ගේම විසඳුම් සෙවීමට පමණක් නොව, නඩු ප්‍රවේශයක් මගින් විනාශයට පත් විය හැකි සබඳතා දිගටම පවත්වාගෙන යාමට ද හැකියාව ලැබේ.

සමථකරණයට යොමු වීමෙන් වෙනත් ක්‍රියාවලීන් සඳහා ඇති අයිතිය අහිමිව කිසිදු අහිතකර ප්‍රතිඵලයක් ඇති නොවේ, මන්දයත් සමථකරණය අසාර්ථක වුවහොත් පාර්ශවයන්ට වෙනත් ක්‍රියාවලීන් අනුගමනය කිරීමට තවමත් අයිතියක් ඇත. පාර්ශ්වයන් සමථකරණයේ නියැලී සිටින අතරතුරදී කාලාවරෝධී කාල සීමාව ක්‍රියාත්මක නොවන බව අදාළ නීති පිළිගනී.

සමථකරණ සේවාව සඳහා ප්‍රවේශය සහතික කර ඇති අතර ක්‍රියාවලිය පහසුවෙන් ආරම්භ කෙරේ. සමථකරණය මිළ අඩුයි. මෙම ක්‍රියාවලිය මගින් පාර්ශ්වයන් විසින් වැදගත් යැයි තමන් විසින්ම හඳුනාගෙන ඇති ගැටළු විසඳීමට ඉඩ සලසයි.

## සම්පත්දායකයා වෙත සටහනක්

- සමථකරණය සඳහා යොමු නොකළ යුතු යැයි සිතන අවස්ථා තිබේදැයි සහභාගිවන්නන්ගෙන් විමසන්න.
- දිවි ගලවා ගත් අය බිය ගැන්වීම, වින්දිතයාට දෝෂාරෝපණය කිරීම වැනි ලිංගික අපරාධ සඳහා සමථකරණය භාවිතා කිරීමේ ප්‍රායෝගික අභියෝග සාකච්ඡා කරන්න. ස්ත්‍රී දූෂණ වැනි බරපතල අපරාධ සඳහා සමථකරණය භාවිතා කිරීමට අදහස් නොකරන බව සලකන්න.
- සමීප සහකරුවන් සම්බන්ධ ප්‍රචණ්ඩත්ව අවස්ථා වලදී සමථකරණය කිරීමේ හැකියාව සාකච්ඡා කරන්න. මෙවැනි සමහර අවස්ථා සමථ මණ්ඩල වෙත යොමු කෙරේ. කාන්තාවන්ට එරෙහිව මෙවැනි ප්‍රචණ්ඩත්ව බරපතල ලෙස නොගැනීම දිවි ගලවා ගත් අයගේ FR උල්ලංඝණය කිරීමක් බව පැහැදිලි කරන්න.

## සමථකරණයට යාමට සුදුසු ආරවුල් මොනවාද?

- ව්‍යතිරේකවලට යටත්ව ආරවුල් ස්වේච්ඡාවෙන් සමථකරණයට යොමු කළ හැක. රජය එක් පාර්ශ්වයකරුවකු වන අවස්ථාවකදී, ආරවුල රජය වෙනුවෙන් දේපළ, මුදල් හෝ වෙනත් අයකර ගැනීමකට අදාළ නම් හෝ නීතිපතිවරයා විසින් කිසියම් වරදක් සඳහා නඩු පවරා ඇති අවස්ථාවක නම් හෝ, ස්වේච්ඡාවෙන් සමථකරණයට යොමු කිරීමට අවසර නැත.
- එසේම, අපරාධ සහ සිවිල් ආරවුල් යන දෙකම අනිවාර්යයෙන්ම සමථකරණයට යොමු කිරීමක් ඇත.

- ස්ත්‍රී දූෂණ හෝ මිනීමැරුම් වැනි බරපතල අපරාධ හැර, දේපළ සම්බන්ධ වැරදි, පහරදීම්, අනවසරයෙන් ඇතුළුවීම සහ අපහාස කිරීම සමථකරණයෙන් විසඳාගත හැකි අපරාධ ලෙස පනතේ විශේෂයෙන් සඳහන් කර ඇත.
- සිවිල් ආරවුලක් සමථකරණය වෙත යොමුකිරීමේ සුදුසුකම් වන්නේ, රුපියල් 500000 නොඉක්මවන ලද, දේපළ, හානි හෝ ඉල්ලුමක් සම්බන්ධව වන ආරවුලක් වීමයි. තවද එය මූලික අයිතිවාසිකම් සහ විවාහ ආරවුල් වැනි ව්‍යතිරේක ගණනාවකට යටත් වේ.
- ඊළඟට පාර්ශවයන්ගේ කැමැත්ත ඇතිව ඕනෑම අධිකරණයකට ආරවුල් සමථකරණය වෙත යොමු කිරීමයි. කෙසේ වෙතත්, මෙම ක්‍රියාවලියේදී පාර්ශවකරුවන්ට තම නිත්‍යානුකූල නියෝජිතයින්ට සමථකරණ ක්‍රියාවලියට සහභාගී වීමට ඉඩ නොදේ.

## සමථකරණය සඳහා අයදුම් කිරීම

ආරවුලේ එක් පාර්ශවයකට හෝ සියලුම පාර්ශවයන් විසින් සමථකරණය ආරම්භ කිරීමට අයදුම් කල හැකිය. සමථකරණයට යොමු විය යුතු පාර්ශ්වයන් අතර එකඟතාවයක් නොමැති නම්, සමථ මණ්ඩල මඟින් සමථකරණය සඳහා කැමැත්ත ලබා ගැනීමේ අරමුණින් පසුබට වන පාර්ශ්වයට කතා කරනු ඇත.

සියලුම පාර්ශ්වයන් සමථකරණය සඳහා එකඟ වූ පසු, සමථකරණය සඳහා ගිවිසුමකට එළඹෙන අතර, එමඟින් සමථකරණය තුලදී එම මධ්‍යස්ථානයේ නීති වලට සහ අනොන්‍ය වශයෙන් එකඟ වූ අනෙකුත් නීතිවලට අනුකූල වීමට පාර්ශවයන් එකඟ වේ.

මෙම ක්‍රියාවලිය සඳහාම සමථ සැසිවලදී සිදුවන දේ සම්බන්ධයෙන් රහස්‍යභාවය සුරැකීම වැනි නීති රීති අනුගමනය කරනු ලබන අතර, පාර්ශවයන් සැසිවාරයට පුද්ගලිකව සහභාගි විය යුතු අතර නීතිමය නියෝජනයකට අවසර නැත. මෙම සැසි පුද්ගලික ඒවා වේ.

## සමථකරණ ක්‍රියාවලිය

තම ප්‍රදේශය තුළ පැන නගින ආරවුලක් සමථයකට පත් කිරීම සඳහා සමථ මණ්ඩලයකට කරන ලද ඉල්ලීමක් මත, ආරවුලේ පාර්ශවකරුවන්ගේ මනාපයන් අනුව සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් වෙත යොමු කරනු ලබයි. මෙම මණ්ඩලය පාර්ශවයන් විසින් තෝරා ගන්නා ලද පූර්ව ස්ථාපිත එකක්, හෝ මණ්ඩලයේ සාමාජිකයින් අතරින් පාර්ශ්වයන්ගේ තේරීම අනුව තනි තනිව තෝරා ගත් සාමාජිකයන්ගෙන් යුත් එකක් විය හැකිය. මණ්ඩලය අවශ්‍ය වන්නේ මණ්ඩලයක් වෙත ආරවුලක් යොමු කිරීම මත වේ.
වැඩිදුර කියවීමට: http://mediation.gov.lk/static/docs/en/justalternative.pdf

## සාරාංශය

ඕනෑම පුද්ගලයෙකුට ඔවුන්ගේ ලිංගික දිශානතිය, සමාජ භාවී අනන්‍යතාවය සහ ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ යනාදිය නොසලකා, ඔවුනට එරෙහිව අපරාධයක් සිදු වී ඇත්නම් එයට පිළියමක් ලබා ගැනීමට අයිතියක් ඇත. අපරාධ වැළැක්වීම සහ නඩු පැවරීමේදී පොලීසිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඔබ සාපරාධී වරදකට ලක්වුවහොත්, ඔබට ළඟම ඇති පොලිස් ස්ථානයට යා හැකිය. අපරාධ නඩුවක් විභාග කිරීම රජය සතු වගකීමකි - එබැවින්, ඔබ නීතිඥයෙකු සඳහා ගෙවීමට අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, ඔබගේ SOGIESC හේතුවෙන් ඔබට පොලිස් ස්ථානයේදී වෙනස්කමක් සිදුවනු ඇතැයි බිය වන්නේ නම්, නීතීඥයෙකු සමඟ පැමිණීම වඩාත් සුදුසුය.

# තෙවන සැසිය: මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සඳහා වන පිළියම්

***සාකච්ඡාවකින් අනතුරුව ක්‍රියාකාරකම***

**කාලය**

පැය 1

**ඉලක්ක කණ්ඩායම**

සියලුම කණ්ඩායම්

කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගිවන්නන් 30

**අරමුණු**

මෙම සැසිය අවසානයේ,

- FR උල්ලංඝණය වීමකදී ගත හැකි පිළියම් තුනක් ආවර්ජනය කර ගැනීමට ,එනම් ශ්‍රේෂ්ඨාධිකරණය හරහා, HRCSL හරහා සහ ඔම්බුඩ්ස්මන් වෙත පැමිණිලි කිරීම
- HRCSL සහ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පැමිණිල්ලක් කරන්නේ කෙසේදැයි දැන ගැනීමට

සහභාගිවන්නන්ට හැකි වනු ඇත

**අවශ්‍ය මෙවලම්**

- ප්‍රොජෙක්ටරය සහ තිරය

**සකස් කිරීම**

- PPT Slides

**පියවර**

- මෙම සැසියේදී, මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් පිළියමක් ලබා ගත හැකි ප්‍රධාන ක්‍රම තුනක් සහභාගිවන්නන් ඉගෙන ගනු ඇති බව පැහැදිලි කරන්න: (1) ශ්‍රේෂ්ඨාධිකරණය හරහා, (2) HRCSL හරහා සහ (3) ඔම්බුඩ්ස්මන් හරහා.
- PPT Slides ආධාරයෙන් දේශනය ඉදිරියට පවත්වාගෙන යන්න.
- ඉදිරිපත් කිරීම අතරතුර සහභාගිවන්නන්ට ප්‍රශ්න ඇසීමට කාලය ලබා දෙන්න.
- සහභාගිවන්නන් සම්බන්ධ කර ගැනීමට ප්‍රශ්න භාවිතා කරන්න.
- ඉදිරිපත් කිරීම සඳහා වන සටහන් පහත 'සටහන්' කොටසින් සොයා ගත හැක.

**සටහන්**

**FR උල්ලංඝණය වීමක් සඳහා පිළියමක් - ශ්‍රේෂ්ඨාධිකරණය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වැනි ව්‍යවස්ථාවට අනුව, FR උල්ලංඝණය කිරීම් පිළිබඳ නඩු විභාග කිරීමට සහ සාධාරණ පිළියමක් ලබා දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ බලය ඇත.

> 126 වන ව්‍යවස්ථාව:
>
> (1) III වන පරිච්ඡේදයෙන් හෝ IV වන පරිච්ඡේදයෙන් හෝ ප්‍රකාශ කොට පිළිගන්නා ලද යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකම යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කිරීමට අත්‍යාසන්නව පැවතීම හා සම්බන්ධ කවර වූ හෝ ප්‍රශ්නයක් විභාග කොට තීරණය කිරීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය.

(2) තමාට සම්බන්ධ එවැනි යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකමක් යම් විධායක ක්‍රියාවක් මඟින් හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කොට ඇති බවට හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පවතින බවට යම් තැනැත්තකු විසින් දෝෂාරෝපණයක් කරනු ලබන අවස්ථාවක ඔහු විසින් ම නැතහොත් ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයකුගේ මාර්ගයෙන්, එතැන් පටන් මාසයක් ඇතුළත, එම කඩ කිරීමෙන් සහනයක් හෝ පිහිටක් ලබා දෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අයැද සිටින ඉල්ලීමක්, තත් කාලයේ බලපවත්නා අධිකරණ රීතිවලට අනුකූලව ශ්‍රේෂ්ඨාධිකරණය අමතා ඉදිරිපත් කරන ලිඛිත පෙත්සමක් මගින් කල හැක්කේ ය. එවැනි ඉල්ලීමක් පිළිබඳව ක්‍රියා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පූර්ව අවසරයක් ලබා ගැනීමෙන් පසුව පමණක් එවැනි ඉල්ලීමක් පිළිබඳව ක්‍රියා කරගෙන යා හැක්කේ ය. එසේ අවසරය ඉල්ලා සිටි විට අවස්තාවෝචිත පරිදි ඒ අවසරය ප්‍රදානය කිරීම හෝ අවසරය දීම ප්‍රතික්ෂේප කිරීම හෝ විනිශ්චකාරවරයන් දෙදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් කළ හැක්කේ ය.

(3) හේබියස් කෝපුස්, සර්ටියොරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ, මන්ඩාමුස් හෝ ක්වෝ වොරොන්ටෝ ස්වභාවයේ වූ රිට් ආඥා සඳහා කරන ලද ඉල්ලීමක් අභියාචනාධිකරණයෙහි විභාග කිරීමේදී, ඒ ඉල්ලීමේ පාර්ශවකරුවකු විසින්, III වන පරිච්ඡේදයේ හෝ IV වන පරිච්ඡේදයේ විධිවිධාන කඩකර ඇති බවට හෝ කඩ කිරීමට අත්‍යාසන්නව ඇති බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ඇති බව ඒ අධිකරණයට පෙනී ගිය අවස්ථාවක ඒ කාරණය තීරණය කිරීම සඳහා ඒ අධිකරණය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත නොපමාව යොමු කළ යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ 2 වන අනුව්‍යවස්ථාවේ සහ 3 වන අනුව්‍යවස්ථාවේ සඳහන් යම් පෙත්සමක් හෝ යොමු කිරීමක් සම්බන්ධයෙන් අවස්ථාගත කරුණු අනුව යුක්ති සහගත යයි හා සාධාරණ යයි ශ්‍රේෂ්ඨාධිකරණය සලකන සහනයක් ප්‍රදානය කිරීමට හෝ විධානයක් දීමට හෝ මූලික අයිතිවාසිකමක් හෝ භාෂා අයිතිවාසිකම කඩ වී නොමැති බවට ඒ අධිකරණයේ මතය වේ නම් ඒ කාරණය අභියාචනාධිකරණයට ආපසු යොමු කිරීමට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට බලය ඇත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන ලද යම් පෙත්සමක් හෝ කරන ලද යම් යොමු කිරීමක් පිළිබඳව ඒ පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ නැතහොත් යොමු කිරීම කරනු ලැබූ දින සිට මාස දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විභාග කොට කටයුතු නිම කළ යුත්තේ ය.

## අත්‍යාසන්න උල්ලංඝණයක් යනු කුමක්ද?

මෙයින් අදහස් කරන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය හරහා ප්‍රතිකර්මයකට ප්‍රවේශ වීමට දැනටමත් FR උල්ලංඝණය කර තිබෙන අවස්ථා වලදී අවශ්‍ය නොවන බවයි. ඔබේ අයිතිවාසිකම් කඩවීමට ආසන්න බව විශ්වාස කිරීමට ඔබට සාධාරණ හේතුවක් තිබේ නම්, ඔබට ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය.

## විධායක හෝ පරිපාලන ක්‍රියාවක් යනු කුමක්ද?

මෙයින් අදහස් වන්නේ ඔබට විධායක හෝ පරිපාලනමය කාර්යයන් ඉටු කරන රාජ්‍ය ආයතනයක් හෝ අධිකාරියක් විසින් FR උල්ලංඝණය වීමක් සිදුවී ඇති විට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පමණක් පිළියමක් ලබා ගත හැකි බවයි. කෙසේ වෙතත්, අධිකරණමය ක්‍රියාමාර්ගයක් හේතුවෙන් මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවුවහොත් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ නොහැක.

**දයානන්ද එදිරිව වීරසිංහ [1983] 2 SLR 84**

- අධිකරණ අභිමතය සාවද්‍ය ලෙස භාවිතා කිරීම මූලික අයිතිවාසිකම් අයදුම්පතක් මගින් ප්‍රශ්න කළ නොහැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේය.

**සත්‍යපාල එදිරිව නීතිපති SC අයදුම්පත් අංක 40/84, SCM 11.05.84.**

- 126 වැනි ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ ක්‍රියාවක් අභියෝගයට ලක් කළ නොහැක.
- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනය මගින් 126 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයාගේ නිල බලයෙන් සිදු කරන ක්‍රියාවකින් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් පිළියම් සෙවීමට හැකියාව තිබුණි. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනයෙන් මෙය ආපසු හැරවිය.

**බණ්ඩාරට එදිරිව වික්‍රමසිංහ [1995] 2 SLR 167**

- පාසලක නියෝජ්‍ය විදුහල්පති, උප විදුහල්පති සහ ගුරුවරයෙකු විසින් සිසුවෙකුට පහර දෙන ලදී.
- විධායක හෝ පරිපාලනමය ක්‍රියාමාර්ගයක් මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමකට වගඋත්තරකරුවන් වගකිව යුතු බවට අධිකරණය තීරණය කළේය.

**නෛතික ස්ථිතිය යනු කුමක්ද?**

මෙයින් අදහස් කරන්නේ තුන්වන පාර්ශවයකට ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ නොහැකි බවයි. තම අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති විට හෝ උල්ලංඝණය වීමට ආසන්න වී ඇති විට අදාල පුද්ගලයා, තමන් විසින්ම (හෝ නීතිඥයෙකු මාර්ගයෙන්) ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ යුතුය.

**ශ්‍රියානි සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ, OIC පොලිස් ස්ථානය පයාගල [2003] 3 SLR 63**

- හමුදාවෙන් පලා ගිය සෙබළෙකු පොලිසිය විසින් වධහිංසා පැමිණවීමේදී ඇති වූ තුවාල හේතුවෙන් මිය ගියේය.
- මියගිය ස්වාමිපුරුෂයා වෙනුවෙන් පෙත්සම ඉදිරිපත් කිරීමට මියගිය පුද්ගලයාගේ බිරිඳට අයිතියක් ඇති බව අධිකරණය තීරණය කළේය

**බුලත්කුලම එදිරිව ලේකම්, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය [2000] 3 SLR 243**

- පොස්පේට් කැණීම සඳහා යෝජිත ගිවිසුමක් මගින් නිවැසියන්ගේ සමානාත්මතාවයට ඇති අයිතිය, නීත්‍යනුකූල රැකියාවක නියැලීමේ නිදහස සහ ශ්‍රී ලංකාව තුළ කැමති පදිංචියක් තෝරා ගැනීමේ නිදහස උල්ලංඝණය වන බව පෙත්සම්කරුවෝ පැවසූහ. මෙම නඩුව ගොනුකර ඇත්තේ මහජන අර්ථසිද්ධි නඩුකරයක් වශයෙන් සාමූහිකවය.
- මෙම නඩුව මහජන අර්ථසිද්ධි නඩුකරයක් වූ පමණින් පෙත්සම්කරුවන් නුසුදුසු නොවන බවත්, ඔවුන්ට තනි තනිව නෛතික ස්ථිතියක් තිබෙන බවත් අධිකරණය ප්‍රකාශ කළේය.

**එක් මාසයක නීතිය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?**

මෙයින් අදහස් කරන්නේ FR උල්ලංඝණයට ලක්වීමෙන් මාසයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ යුතු බවයි.

**සමන් එදිරිව ලීලදාස [1989] 1 SLR 1**

- දෙසැම්බර් 1 වැනිදා රිමාන්ඩ් භාරයේ සිටියදී පෙත්සම්කරුට පහර දී ඇත. ඇප ලැබෙන විට දෙසැම්බර් 2 වැනිදා සිට 11 වැනිදා දක්වා ඔහු රෝහල්ගතව සිට ඇත. ඔහු ජනවාරි 7 වැනි දින මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළේය.
- ඔහු රෝහලෙන් පිටව ගිය පසු පමණක් මාසයක කාලය ක්‍රියාත්මක වීමට පටන් ගන්නා බව අධිකරණය තීරණය කළේය.

## FR උල්ලංඝණය වීමක් සඳහා පිළියමක්: (HRCSL)

### ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) යනු 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ස්වාධීන කොමිෂන් සභාවකි.
HRCSL එක ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කර ඇතත් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විධිමත් ලෙස ස්ථාපිත කර නොමැත.
මානව හිමිකම් කොමිසමේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇත. මීට අමතරව දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල 10ක් ඇත.

**කොමිෂන් සභාවේ කාර්යයන්**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
- ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් ශ්‍රී ලංකා රාජ්‍යයට අනුකූල බව සහතික කිරීම.
- මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් හෝ අත්‍යාසන්න මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳ ඕනෑම පැමිණිල්ලක් විමර්ශනය කිරීම.
- වන්දි ඇතුළු සුදුසු පිළියම් ලබා දීම සහ පුද්ගලයෙකුගේ නිදහස අහිමි වන (චලනය වීමේ නිදහස සහ වෙනත් අය විසින් අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීමෙන් නිදහස) ඕනෑම ස්ථානයක් පරීක්ෂා කිරීමට සහ අධීක්ෂණය කිරීමට අසීමිත ප්‍රවේශයක් ලබා දීම.
- කොමිෂන් සභාව ව්‍යවස්ථාපිතව සහතික කර ඇති අයිතිවාසිකම් අර්ථකථනය කිරීම සඳහා ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් භාවිතා කරයි

**කොමිසමේ බලතල**

- ඕනෑම අධිකරණයක් ඉදිරියේ මූලික අයිතිවාසිකම් සම්බන්ධ කාරණයකට මැදිහත් වීමේ බලය.
- ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා ජාතික නීති, පරිපාලන නියෝග සහ භාවිතයන් විමර්ශනය කිරීමේ අධිකාරිය - රජයට නිර්දේශ නිකුත් කිරීම හරහා සිදු කෙරේ.

**මානව හිමිකම් කොමිසන් සභාවට පැමිණිල්ලක් කරන්නේ කෙසේද?**
වින්දිතයෙකුට හෝ මූලික අයිතිවාසිකම් කඩවීමකට ලක්වූවන්ගේ කණ්ඩායමකට (හෝ අත්‍යාසන්න උල්ලංඝණ) හෝ වින්දිතයන් නියෝජනය කරන පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට HRCSL වෙත පැමිණිල්ලක් කළ හැකිය. කොමිෂන් සභාවට තමන්ගේම යෝජනාවක් මත වුවද මූලික අයිතිවාසිකම් කඩවීමක් පිළිබඳ පරීක්ෂා කර විමර්ශනය කළ හැකිය.

පැමිණිල්ලක් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ හැක. පැමිණිලි පෝරම HRCSL (ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාල) වෙතින් හෝ HRCSL වෙබ් අඩවියෙන් https://www.hrcsl.lk/make-a-complaint/. වෙතින් නොමිලේ ලබා ගත හැක. පැමිණිල්ල පුද්ගලිකව, තැපෑලෙන්, විද්‍යුත් තැපෑලෙන්, ෆැක්ස් මගින් හෝ HRCSL ක්ෂණික ඇමතුම් අංකය හරහා තොරතුරු ලබා දීමෙන් (1996 ඇමතීමෙන්) ඉදිරිපත් කළ හැක.

පැමිණිල්ල කොමිසමේ විධානයන්ට යටත් නොවේ නම් එය පිළිගනු නොලැබේ. කෙසේ වෙතත්, එය වෙනත් ආයතනයක විධානයකට යටත් වුවහොත් ක්‍ෂේත්‍ර විසින් පැමිණිලිකරු එම ආයතනය වෙත යොමු කරනු ඇත හෝ පැමිණිල්ල එම ආයතනය වෙත යොමු කරනු ඇත (උදා: පරිපාලන ආයතන මගින් සිදුවන අසාධාරණයන් ඔම්බුඩ්ස්මන් කාර්යාලය වෙත යොමු කළ හැක).

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම**
මානව හිමිකම්/මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවී ඇත්නම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ (HRCSL) පැමිණිල්ලක් කිරීමට ඔබට හිමිකම් ඇත.

**පැමිණිල්ල ලිඛිතව හෝ වාචිකව ඉදිරිපත් කළ හැකිය**

- පැමිණිල්ලක් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ හැක
- පැමිණිලි ආකෘති පත්‍ර HRCSL (ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාල) වෙතින් හෝ HRCSL වෙබ් අඩවියෙන් නොමිලේ ලබා ගත හැක. https://www.hrcsl.lk/home/
- පුද්ගලිකව පැමිණිල්ලක් ගොනු කළ හැක, තැපෑලෙන්, විද්‍යුත් තැපෑලෙන්, ෆැක්ස් මගින් හෝ HRCSL ක්ෂණික ඇමතුම් අංකය හරහා තොරතුරු ලබා දීමෙන් එවිය හැක.
- මෙයින් පැමිණිලි පෝරමය සොයාගන්න:https://www.hrcsl.lk/wp-content/uploads/2020/03/Complaint-Form-final-new-01-01-2020-1-2-1.pdf
- මෙහි පැමිණිල්ල ඉදිරිපත් කරන්න:https://www.hrcsl.lk/make-a-complaint/complaint-form

ඔබට ලිඛිතව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට නොහැකි නම්, වාචිකව පැමිණිල්ල භාර ගන්නා ලෙස නිලධාරියෙකුගෙන් ඉල්ලා සිටිය හැක.

**පැමිණිල්ලක ඇතුළත් කළ යුතු තොරතුරු මොනවාද?**

- උල්ලංඝණය වී ඇති අයිතිවාසිකම් හඳුනා ගන්න.
- අයිතිවාසිකම් උල්ලංඝණය වූ පුද්ගලයා හඳුනා ගන්න.
- උල්ලංඝණය කිරීම් සඳහා වගකිව යුත්තේ කවුරුන්ද යන්න හඳුනා ගන්න.
- අයිතිවාසිකම් උල්ලංඝණය කළේ කුමන ආකාරයෙන්ද.
- උල්ලංඝණය සිදු වූ ස්ථානය සහ වේලාව.
- ඔබ සොයන පිළියම් මොනවාද.
- කොමිසමට පැමිණිලි කළ හැක්කේ කාටද?
- මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමක (හෝ ආසන්න උල්ලංඝණයක) වින්දිතයෙකු හෝ වින්දිතයින් පිරිසක් විසින්.
- වින්දිතයකු/වින්දිතයන් නියෝජනය කරන පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින්.
- මාධ්‍යවල වාර්තා කළහොත් හෝ HRCSL වෙත තොරතුරක් ලැබුනහොත්, වින්දිතයෙකු විසින් කරන ලද නිශ්චිත පැමිණිල්ලක් නොමැතිව වුවද HRCSL හට මැදිහත් විය හැක.

කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමකින් තොරවම තමන්ගේම අභිමතය මත මූලික අයිතිවාසිකම් කඩවීමක් පරීක්ෂා කර විමර්ශනය කළ හැක.

**ක්‍රියා පටිපාටිය**

පැමිණිල්ල කොමිසමේ විධානයට යටත් වන්නේ නම්; නඩුව ඉදිරියට ගෙන යාමට ප්‍රමාණවත් හේතු තිබේද නැද්ද යන්න තීරණය කිරීම සඳහා මූලික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙම නඩුව විභාග කරනු ලබන්නේ, පෙත්සම්කරු ඇමතීම, වග උත්තරකරුගෙන් වාර්තාවක් කැඳවීමෙනි. බැලූ බැල්මට නඩුවක් තිබේ නම් (පළමු අවස්ථාවේ එය බැලූ බැල්මට වලංගු නඩුවක් නම්); කරුණු විමසා සමථකරණය මඟින් විසඳා ගැනීමට උත්සාහ කරන්න. සමථකරණය අසාර්ථක වූ විට, FR උල්ලංඝණය කිරීමක් අනාවරණය වුවහොත් අදාළ බලධාරීන්ට නිර්දේශයක් ඉදිරිපත් කළ හැකිය. නිදහස අහිමි කිරීම හෝ වධහිංසා පැමිණවීම සම්බන්ධයෙන් වන පැමිණිල්ලක් නම් සමථකරණය හෝ සාමදාන කිරීම භාවිතා නොකෙරේ.

**මානව හිමිකම් කොමිසමේ ඕනෑම කාර්යාලයකට පැමිණිලි කළ හැකිය;**

- කොළඹ ප්‍රධාන කාර්යාලය අංක 14 ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 04 ශ්‍රී ලංකාව.
- ප්‍රාදේශීය කාර්යාල 10න් එකක් (අම්පාර, අනුරාධපුර, මඩකලපුව, මහනුවර, බදුල්ල, යාපනය, කල්මුණේ, ත්‍රිකුණාමලය, වවුනියාව, මාතර)
- පුත්තලම උප කාර්යාලය
- උල්ලංඝණය සිදු වූ ස්ථානය කුමක් වුවත්, මෙම ඕනෑම කාර්යාලයකදී පැමිණිලි කළ හැකිය

## FR උල්ලංඝණය වීමක් සඳහා පිළියමක්: ඔම්බුඩ්ස්මන්

ඕනෑම පුද්ගලයෙකුට ඔහුගේ/ඇයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති විට හෝ රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන හෝ වෙනත් සමාන ආයතන විසින් ගනු ලබන පරිපාලනමය තීරණ හෝ වෙනත් යම් අසාධාරණයක් සිදු වී ඇති විට එවැනි අසාධාරණයන් වළක්වා ගැනීම සඳහා සහනයක් ලබා ගත හැකි ප්‍රධාන ආයතනයක් ලෙස පරිපාලනය සඳහා වූ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය (ඔම්බුඩ්ස්මන්) හඳුන්වාදිය හැකිය.

එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වැනි ව්‍යවස්ථාව සමග 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 45 වැනි ව්‍යවස්ථාව කියවීම යටතේ පිහිටුවා ඇති කාර්යාලයක් වේ. ඔම්බුඩ්ස්මන්වරයා පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.

ඔම්බුඩ්ස්මන්වරයාගේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ රාජ්‍ය නිලධාරියකුගේ ක්‍රියාවක් මඟින් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමකට හෝ ඒ හා සමාන අසාධාරණයන් සම්බන්ධයෙන් සිදුවූ හෝ සිදුවෙමින් පවතින හෝ සිදුවීමට ඉඩ ඇති පැමිණිලි සම්බන්ධව විමර්ශන පවත්වා සාධාරණ නිර්දේශයන් ඉදිරිපත් කිරීමයි.

**පැමිණිල්ලකට ඇතුළත් කළ යුතු අත්‍යවශ්‍ය තොරතුරු**

- පැමිණිල්ල පැහැදිලිව සහ කෙටියෙන් සරල භාෂාවෙන් ලිවිය යුතුය. (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි)
- පැමිණිල්ල ඉදිරිපත් කරන්නේ කුමන තීරණයකට එරෙහිවද යන්න සහ පැමිණිල්ල ඉදිරිපත් කරන්නේ කුමන නිලධාරියාට එරෙහිවද යන්න සහ ඔහු දරන තනතුර සමඟ ඔහුගේ/ඇයගේ ලිපිනය පැහැදිලිව සඳහන් කිරීම අවශ්‍ය වේ.
- සිදු වූ බව කියන අසාධාරණය ඔප්පු කිරීම සඳහා වැදගත් වන ලිපි ලේඛනවල ඡායා පිටපත් ඇමිණීම වඩාත් යෝග්‍ය වේ. එම ලේඛනවල මුල් පිටපත් අමුණනු නොලැබේ.
- පැමිණිලිකරු විසින් ඉල්ලා සිටින සහනය පැමිණිල්ල අවසානයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

ලිපි හුවමාරු කර ගැනීමෙන් නිගමනයකට පැමිණීමට අපහසු නම්, අදාළ සියලු පාර්ශවයන් කැඳවා ඔම්බුඩ්ස්මන්වරයා ස්වාධීන පරීක්ෂණයක් පවත්වා සුදුසු නිර්දේශ ලබා දීමෙන් පසු ගැටලුව විමර්ශනයට නියම කරනු ලැබේ. අවසානයේදී, ඔම්බුඩ්ස්මන්වරයා විසින් ගනු ලබන තීරණ / නිර්දේශ / යෝජනා පැමිණිලිකරුට සහ අදාළ නිලධාරීන්ට ලිඛිතව දැනුම් දීමට පියවර ගනු ලැබේ. එවැනි තීරණ / නිර්දේශ / යෝජනා නිශ්චිත කාලයක් තුළ ක්‍රියාත්මක කරන ලෙස ඔම්බුඩ්ස්මන් වගඋත්තරකාර පාර්ශවයෙන් ඉල්ලා සිටී.

යම් ආයතන ප්‍රධානියෙකු (බලයලත් නිලධාරියෙකු) එකී නිර්දේශය සතුටුදායක ලෙස ක්‍රියාත්මක නොකරන්නේ නම් හෝ නියමිත කාලසීමාව තුළ කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නේ නම්, ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඔහුගේ අවසන් වාර්තාවේ පිටපතක් සමඟ ඔහුගේ නිර්දේශය, පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ජනාධිපතිවරයාට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතුය. missig

පැමිණිලිකරු ආරක්ෂා කිරීම සඳහා නීතීඥවරයෙකුගේ හෝ වෙනත් අයෙකුගේ සහය ලබාගැනීමට පනත මගින් අවසර ලබාදී නැත. කෙසේ වෙතත්, පැමිණිලිකරු ශාරීරිකව නුසුදුසු හෝ දුර්වලතා ඇති විට; ඔම්බුඩ්ස්මන්වරයාගේ අභිමතය පරිදි ඔහුගේ/ඇයගේ ඥාතියකුගේ හෝ ප්‍රතිලාභ ලබන්නාගේ සහාය ලබා ගත හැක.

**ඔම්බුඩ්ස්මන්වරයා මගින් විමර්ශනය කළ නොහැකි පැමිණිලි**

- රැකියා/නිවාස සඳහා ඉල්ලීම්. (පනතේ 10(2) වගන්තිය)
- මහජන ආරක්ෂාවට අදාල හා මහජන ආරක්ෂක ආඥා පනතේ සඳහන් කරුණු වලට අදාල වන පැමිණිලි. (පනතේ 11 (ආ) (i) වගන්තිය)
- මහජන සාමය පවත්වාගෙන යාම භාර සන්නද්ධ හමුදාවල, පොලිස් හමුදාවේ හෝ වෙනත් හමුදාවල සාමාජිකයකුව සිටින හෝ සිටි, යම් තැනැත්තකුට අදාල සේවා නියමයන් හා කොන්දේසි සම්බන්ධයෙන් යොමු කරනු ලබන පැමිණිලි. (පනතේ 11(ආ)(iii) වගන්තිය)
- කිසියම් ඉල්ලීමකට අදාලව අධිකරණ ක්‍රියාමාර්ගයකට එළඹී ඇති හෝ ඒ පිළිබඳව අධිකරණ තීරණයක් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථා. (පනතේ 11(ආ)(iv) වගන්තිය)
- රජයේ නිලධරයන්ගේ පත්කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම්, විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වන පැමිණිලි. (පනතේ 11(ආ)(v) වගන්තිය)
- විගණකාධිපතිවරයා විසින් පවත්වනු ලැබූ හෝ පවත්වනු ලබන විගණන කටයුතු වලට සම්බන්ධ පැමිණිලි. (පනතේ 11(ආ)(vi) වගන්තිය)
- අනවශ්‍ය ලෙස ප්‍රමාදවීමකින් පසුව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි. (අනවශ්‍ය ප්‍රමාදය) (පනතේ 13(1)(ඇ) වගන්තිය)

- රාජ්‍ය ප්‍රතිපත්තින් සම්බන්ධව උද්ගතවන ගැටළු හෝ අමාත්‍ය මණ්ඩල තීරණ සම්බන්ධයෙන් වන ඉල්ලීම්.

- මැතිවරණ කොමසාරිස්වරයාගේ මැතිවරණ කටයුතු වලට අදාළ සිදුවීම්

- පුද්ගලික සමාගම් ඇතුළු පෞද්ගලික පාර්ශවකරුවන් අතර ඇතිවන ආරවුල් වලට අදාළ කටයුතු.

- නිර්නාමිකව හෝ අත්සන නොමැතිව ලැබෙන පැමිණිලි.

## සාරාංශය

මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීමක් සම්බන්ධව පිළියම් සෙවීමට හැකි ආකාර තුනකි. පළමුවැන්න ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වැනි ව්‍යවස්ථාවට අනුව, එවැනි උල්ලංඝණය කිරීමකින් මාස 1ක් ඇතුළත පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් මූලික අයිතිවාසිකමක් උල්ලංඝණය වීමකට හෝ අත්‍යාසන්න උල්ලංඝණය වීමක් සඳහා පිළියමක් සෙවිය හැකිය. සාමාන්‍යයෙන් මෙය සිදු කළ යුත්තේ අයිතිවාසිකම් උල්ලංඝණය වූ පුද්ගලයා හෝ ඔහුගේ නීතිඥයා විසිනි.

ඔබට HRCSL වෙත අයදුම් කිරීමට හෝ පිළියමක් අපේක්ෂාවෙන් ඔම්බුඩ්ස්මන් වෙත ලිවිය හැක.

# හතරවන සැසිය: අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීමේදී අයිතිවාසිකම්

***සාකච්ඡාව***

**කාලය**
විනාඩි 45 යි

**ඉලක්ක කණ්ඩායම**
සියලුම කණ්ඩායම්
කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගිවන්නන් 30

**අරමුණු**
මෙම සැසිය අවසානයේ,

- අත්අඩංගුවේ සිටින හෝ රඳවාගෙන සිටින පුද්ගලයෙකුට ඇති අයිතිවාසිකම් දැනගැනීමට,
- අත්අඩංගුවට ගැනීමකදී අනුගමනය කරන මූලික ක්‍රියා පටිපාටිය දැනගැනීමට

සහභාගිවන්නන්ට හැකි වනු ඇත.

**අවශ්‍ය මෙවලම්**

- White Board හා මාර්කර් පෑන්
- ප්‍රොජෙක්ටරය හා තිරය

**සකස් කිරීම**

- PPT Slides

**පියවර**

- මෙම සැසියේදී, සහභාගිවන්නන් අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම පිළිබඳව ඉගෙන ගන්නා බව පැහැදිලි කරන්න.
- අත්අඩංගුවේ සිටින පුද්ගලයෙකුගේ අයිතිවාසිකම් මොනවාදැයි සහභාගිවන්නන්ගෙන් විමසන්න. ඔවුන් රූපවාහිනියෙන් හා චිත්‍රපටවලින් අදහස් ලබා ගෙන තිබිය හැකිය. සහභාගිවන්නන්ට යුගල වශයෙන් සාකච්ඡා කිරීමට ඉඩ හැර, අත්අඩංගුවේ සිටින හෝ රඳවාගෙන සිටින පුද්ගලයෙකුට තම මානව හිමිකම් ආරක්ෂා කරගැනීම සඳහා තිබිය යුතු යැයි ඔවුන් සිතන අයිතිවාසිකම් 3ක් ලිවීමට ඉඩ හරින්න. මෙම අභ්‍යාසය සඳහා සහභාගිවන්නන්ට විනාඩි 10ක කාලයක් ලබාදෙන්න.
- ඔවුන් ලියා ඇති දේ අසා සහ White Board එකෙහි ප්‍රතිචාර සඳහන් කරන්න.
- බොහෝ සහභාගිවන්නන්ට සමාන ප්‍රතිචාර තිබිය හැක. නව සහ වෙනස් ප්‍රතිචාර ඉස්මතු කරන්න.
- සියලුම සහභාගිවන්නන් යුගලයන් දායක වූ පසු, PPT Slides ආධාරයෙන් ඉදිරිපත් කිරීම කරගෙන යන්න. ඒ සඳහා සටහන් පහත 'සටහන්' කොටසෙන් සොයාගත හැකිය.

## සටහන්

### අත්අඩංගුවේ සිටීමකදී හෝ රඳවා තබා ගැනීමකදී ඇති අයිතිවාසිකම්

අත්අඩංගුවේ සිටින විටද පුද්ගලයකුට අයිතිවාසිකම් හිමිව ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ව්‍යවස්ථාව මඟින් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම සහ දඬුවම්වලින් නිදහස මූලික අයිතිවාසිකම් ලෙස සහතික කරයි.

එනම්, අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම සහ දඬුවම් දීම කල යුත්තේ නීතියට අනුව වීමයි.
කෙනෙකුගේ SOGIESC කුමක් වුවත්, නීතිය මගින් ස්ථාපිත කර ඇති ක්‍රියා පටිපාටියට අනුව හැර කිසිඳු පුද්ගලයෙකු අත්අඩංගුවට නොගත යුතුය.

- අත්අඩංගුවට ගන්නා සෑම පුද්ගලයකුටම ඔහු අත්අඩංගුවට ගැනීමට හේතුව දැනුම් දිය යුතුය.
- අත්අඩංගුවට ගන්නා නිලධාරියා නිල ඇඳුමින් නොසිටින්නේ නම්, ඔහුගේ නම, තනතුර, අංකය සහ පොලිස් ස්ථානය සඳහන් කිරීමෙන් ඔහු හඳුන්වාදිය යුතුය.
- අත්අඩංගුවේ පසුවන හෝ රඳවාගෙන සිටින සෑම පුද්ගලයෙකුම ළඟම පිහිටි බලතල ඇති අධිකරණයේ විනිසුරුවරයා වෙත ඉදිරිපත් කළ යුතුය
- වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත් අවස්ථාවකදී කෙනෙකුට අත්අඩංගුවේ සිටිය හැක්කේ පැය 24 ක් වැනි කාලයක් පමණි.

අත්අඩංගුවට ගැනීමේදී පොලිස් නිලධාරියා විසින් අත්අඩංගුවට ගන්නා පුද්ගලයාට එසේ කිරීමට හේතුව දැනුම් දිය යුතුය.

- සෝදිසියකදී දී, සෝදිසියට හේතුව සහ සාධාරණ සැකයට හේතුව පැවසිය යුතුය.
- කාන්තාවක් අත්අඩංගුවට ගැනීමේදී, කාන්තා පොලිස් නිලධාරිනියක සිටිය යුතුය.
- සෝදිසියක් සඳහා ඔබව පොලිස් ස්ථානයට ගෙන යන ලෙස ඉල්ලීමට ඔබට හිමිකම් ඇත.

අත්අඩංගුවට ගත් පසු, අත්අඩංගුවට ගත් පුද්ගලයාගේ හඳුනන අයකුට, මිතුරෙකුට, පවුලේ අයකුට හෝ නීතිඥයෙකුට අත්අඩංගුවට ගැනීම පිළිබඳව දැනුම් දීම පොලිස් නිලධාරියා සතු වගකීමක් වේ.

ඔබ අත්අඩංගුවේ තබා ඇත්නම්, ඔබට ඇඳුම්, ජලය සහ ආහාර වැනි මූලික පහසුකම් ඉල්ලා සිටිය හැකිය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි ව්‍යවස්ථාව මගින් වධ හිංසාවට ලක්නොවීම මූලික අයිතිවාසිකමක් ලෙස සහතික කරයි. මින් අදහස් වන්නේ පුද්ගලයකු අත්අඩංගුවේ පසුවන විට පහර දීමට, ශාරීරිකව දඬුවම් කිරීමට, වාචිකව අපයෝජනයට ලක් කිරීමට හෝ ලිංගික අතවර කිරීමට පොලිසියට නොහැකි බවයි. මේ මූලික අයිතිවාසිකම කුමන තත්වයකදී වුවද බැහැර කළ නොහැක. පුද්ගලයෙකුගේ SOGIESC හෝ රැකියාව කුමක් වුවත් මෙම අයිතිවාසිකම් අදාළ වේ. එයින් අදහස් කරන්නේ සියලුම පුද්ගලයින් - ලිංගික වෘත්තියෙහි නියැලෙන අය, සමරිසි පුරුෂයින්, සමරිසි කාන්තාවන්, ද්විරිසි පුද්ගලයන්, අන්තර් ලිංගික හෝ සංක්‍රාන්තික සමාජභාවීය පුද්ගලයින් ඇතුළු සියලු දෙනාටම මෙම අයිතීන් සඳහා හිමිකම් ඇති බවයි.

### සම්පත්දායකයා වෙත සටහන

- පොලීසිය විසින් සැකකරුවෙකුට පහර දිය හැකි අවස්ථාවන් තිබෙනවාදැයි සහභාගීවන්නන් ගෙන් විමසන්න.
- කිසිම අවස්ථාවක උසාවියේදී පාපොච්චාරණයක් පිළිගත නොහැකි බව පැහැදිලි කරන්න. පිළිගත හැක්කේ පාපොච්චාරණයේ ප්‍රතිඵලයක් ලෙස සොයාගත් සාක්ෂි පමණි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ව්‍යතිරේකයකි.
- සෑම අවස්ථාවකදීම වධහිංසා වලින් ආරක්ෂා වීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න.
- ඔබට ජෙරල්ඩ් මර්වින් පෙරේරා [2003] 1 SLR 317 නඩුව යොමුවක් ලෙස භාවිතා කළ හැක.

**පොලිසියේ වැරදි සම්බන්ධව, ශ්‍රී ලංකා පොලිසියේ ක්‍රියාවන්ට එරෙහිව පැමිණිල්ලක් කිරීමට ඔබට අවශ්‍යනම්;**

- පොලිස් නිලධාරියෙකුගේ හෝ පොලිස් සේවයේ ක්‍රියාවකින් අගතියට පත් ඕනෑම තැනැත්තෙකුට මහජන පැමිණිලි විමර්ශන අංශයට (PCID) හෝ ජාතික පොලිස් කොමිසමේ ඕනෑම පළාත් කාර්යාලයකට පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැක.
- පළාත් කාර්යාලයට ලැබෙන මහජන පැමිණිලි පිළිබඳ විමර්ශන භාරව කටයුතු කළ යුතු පළාත් අධ්‍යක්ෂවරයකු සෑම පළාතකටම පත් කළ යුතුය. ඔහු කොමිසමේ PCID හි අධ්‍යක්ෂ වෙත සෘජුවම වාර්තා කළ යුතුය.
- පොලිස් නිලධාරියෙකුට හෝ පොලිස් සේවයට එරෙහිව ලැබෙන ඕනෑම මහජන පැමිණිල්ලක් සතියක් ඇතුළත බලයලත් නිලධාරියෙකු විසින් පිළිගත යුතුය.

වරෙන්තුවක් ඇතිව හෝ නැතිව අත්අඩංගුවට ගනු ලැබුවත් **වහාම නීති උපදේශකවරයෙකුගේ පැමිණීම ඉල්ලා සිටීම** සුදුසුය.

## සම්පත්දායකයා වෙත සටහන

- සැසිවාරය ආරම්භයට පෙර, ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික සමාජභාවීය පුද්ගලයන්ට සහ ලිංගික ශ්‍රමිකයන්ට එරෙහිව සිදුවී ඇති ලිංගික වධහිංසා පිළිබඳ සාක්ෂි පිළිබඳව දැනුවත් වන්න.
- කියවීම: Andrea Nichols, *'Dance Ponnaya Dance: Police Abuse Against Transgender Sex Workers in Sri Lanka'*, 2010 https://journals.sagepub.com/doi/10.1177/1557085110366226

## සාරාංශය

අත්අඩංගුවේ සිටින විට හෝ රඳවා තබාගෙන සිටින විට වුවද පුද්ගලයකුට මූලික අයිතිවාසිකම් හිමිව ඇත. ප්‍රධානම අයිතිවාසිකමක් වන්නේ අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීමේ ක්‍රියාවලිය නීතියට අනුව සිදු කළ යුතු බවයි. වධ හිංසාවලින් නිදහස් වීම යනු උල්ලංඝණය කළ නොහැකි පරම අයිතියකි. රැඳවුම් භාරයේ හෝ අත්අඩංගුවේ සිටින අයකුට එරෙහිව සිදුකරනු ලබන ඕනෑම ආකාරයක වධහිංසා පැමිණවීමකට එරෙහිව පිළියමක් ලබා ගැනීම යනු ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ඇති මූලික අයිතිවාසිකම කි.

# පස්වන සැසිය: සාපරාධී වරදකට හෝ මානව හිමිකම් උල්ලංඝණයක් සඳහා වන ප්‍රායෝගික ප්‍රතිකර්ම

***භූමිකා රංගනය***

## කාලය

පැය 2

## ඉලක්ක කණ්ඩායම

සියලුම කණ්ඩායම්

කණ්ඩායමකට ආසන්න වශයෙන් සහභාගිවන්නන් 30

## අරමුණු

මෙම සැසිය අවසානයේ,

- ලබා දී ඇති සාපරාධී වරදක් හෝ FR උල්ලංඝණයක් පිළිබඳ තත්ත්වය විශ්ලේෂණය කර යුක්තිය පසිඳලීම සඳහා හොඳම ක්‍රියාමාර්ගය තීරණය කිරීමට,
- ධනාත්මක ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහා පවතින සහන යාන්ත්‍රණ භාවිතා කරන ආකාරය අවබෝධ කර ගැනීමට

සහභාගිවන්නන්ට හැකි වනු ඇත.

## අවශ්‍ය මෙවලම්

මෙම සැසි සැලැස්ම අවසානයේ ඇති ඇමුණුම් වල මුද්‍රිත පිටපත්

## සැකසුම

නැත

## පියවර

- සහභාගිවන්නන් අපරාධයක් සහ මානව හිමිකම් උල්ලංඝණයක් අතර වෙනස හඳුනා ගත් සැසිය ආවර්ජනය කරන්න. මෙම සැසියේදී, සහභාගීවන්නන් එම අවස්ථාවන්ම රඟදක්වා සුදුසු සහන යාන්ත්‍රණ සොයා ගත යුතු බව පැහැදිලි කරන්න.
- සහභාගීවන්නන් කණ්ඩායම් 5 කට බෙදන්න.
- එක් එක් කණ්ඩායමකට අවස්ථා 1 බැගින්, කණ්ඩායම් අතර සිද්ධීන් ඇතුලත් මුද්‍රණ පිටපත් බෙදාහරින්න (සැසි සැලැස්ම අවසානයේ ඇති ඇමුණුමේ ඇත).
- ප්‍රධාන චරිතය/යන්ට මුහුණ දිය යුතු වන අභියෝග කිහිපයක් සහ ඔවුන් ඒවා ජය ගන්නේ කෙසේද යන්න පිළිබඳව සිතා බලන ලෙස සෑම කණ්ඩායමකින්ම ඉල්ලා සිටින්න. ප්‍රධාන චරිතයට/යන්ට ධනාත්මක/යෝග්‍ය ප්‍රතිඵල ලබා ගත හැකි හොඳම ආකාරය සොයා ගැනීමට කණ්ඩායම්වලින් ඉල්ලා සිටින්න.
- කණ්ඩායම්වලට නිර්මාණශීලී වීමට ඉඩ දී ඇති අතර හාස්‍යය භාවිත කළ හැක.
- සහභාගිවන්නන්ට විනාඩි 6-8ක රංගනයක් සඳහා සූදානම් වීමට විනාඩි 30ක කාලයක් ලබා දෙන්න
- සෑම කණ්ඩායමක් සමඟම අවම වශයෙන් එක් වරක්වත් සහභාගී වී ඔවුන්ට සහාය වන්න.
- එක් කණ්ඩායමක් ඉදිරිපත් කිරීමෙන් පසු, ඔවුන්ට අත්පොළසන් නාදයක් ලබා දී, සිද්ධියේ ප්‍රධාන අංග සාරාංශ කරන්න - ප්‍රධාන චරිතය/න් මුහුණ දෙන අභියෝග සහ ඔවුන් එවැනි අභියෝග ජයගත් ආකාරය හඳුනා ගන්න. නීතිය ගැන දැනුවත් වීම හෝ නීති උපදෙස් ලබා ගැනීම වැනි ඕනෑම හොඳ ක්‍රියාවක් ඉස්මතු

කරන්න. යෝග්‍ය ප්‍රතිඵලයකට එළඹීම සඳහා සාකච්ඡා කිරීමේදී, සන්සුන්, පැහැදිලි සහ ස්ථිර නමුත් ප්‍රචණ්ඩකාරී නොවන සන්නිවේදනයක වැදගත්කම පැහැදිලි කරන්න.

- මෙය පුහුණුවේ අවසාන සැසිය වන බැවින්, මෙම සැසියෙන්, මෙම දිනයෙන් හෝ සම්පූර්ණ වැඩමුළුවෙන් ප්‍රශ්න ඇසීමට සහභාගිවන්නන්ට අවස්ථාවක් ලබා දෙන්න.

- යම් කාලයක් ඉතිරිව තිබේ නම්, මෙම පුහුණුවෙන් අමතක නොවන දෙයක් බෙදා ගැනීමට සහභාගිවන්නන්ට ආරාධනා කළ හැක.

## සාරාංශය

අද අපි සාකච්ඡා කළේ සාපරාධී වරදක් හෝ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් පිළියම් සොයන්නේ කෙසේද යන්නයි.

ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ අපරාධ වැරදි දක්නට ලැබේ. තුවාල, මිනීමැරුම්, ලිංගික අතවර, ස්ත්‍රී දූෂණ, කප්පම් ගැනීම්, අපහාස කිරීම සහ සොරකම් දණ්ඩ නීතිමය වැරදි සඳහා පොදු උදාහරණ වේ. ලිංගික හිරිහැර කිරීමේ වරදට මාර්ගගත (Online) සහ මාර්ගගත නොවන (offline) ලිංගික හිරිහැර ඇතුළත් වේ. ඔබ සාපරාධී වරදකට මුහුණ දී ඇත්නම්, ඔබට ගත හැකි හොඳම ක්‍රියාමාර්ගය වන්නේ පොලිස් ස්ථානයකට යෑමයි. පොලිස් ස්ථානයකට යාමට පෙර, ඔබ සොයන පිළියම කුමක්දැයි ඔබ තීරණය කර තිබිය යුතුය. අපරාධ නඩුවක් විභාග කිරීමේ වගකීම රජය සතුය. පොලිසිය සැකකරු සම්බන්ධ කර ගැනීම හෝ අල්ලා ගනු ඇත. වරද සුළු අපරාධයක් නම්, ඔබ සමථ මණ්ඩලවලට යොමු කරනු ලැබේ. ඔබට සමථයකට පැමිණිය නොහැකි නම්, පැමිණිල්ල උසාවියට යොමු කරනු ලබයි.

ජාතික හා ජාත්‍යන්තර නීතිය මගින් මානව හිමිකම් පිළිගෙන ඇත. මේවා මිනිසකු වී ඉපදීම නිසාම ඔබට හිමිව ඇති අයිතිවාසිකම් ය. මෙම අයිතීන් විශ්වීය සහ අහිමි කළ නොහැකි අයිතීන් වේ. ජාතික නීතිය ඇතැම් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් ලෙස පිළිගනී. මේවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇත. මෙම අයිතිවාසිකම් රාජ්‍යයට එරෙහිව ක්‍රියාත්මක කළ හැකි ය - විධායක හෝ පරිපාලන ක්‍රියාමාර්ගයක් මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇතිවිට හෝ උල්ලංඝණය කිරීමට ආසන්නව ඇතිවිට, අයෙකුට මූලික අයිතිවාසිකම් පෙත්සමක් සමඟ ශ්‍රේෂ්ඨාධිකරණයට යා හැකිය. මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී මාසයක් ඇතුළත ඔබට ඔබ විසින්ම හෝ නීතිඥයෙකු විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය.

නීතිය ඉගෙන ගැනීම සාධාරණ පිළියමක් ලබා ගැනීමේ හැකියාව සඳහා වන පළමු පියවරයි. නීතිය ඉගෙන ගැනීමට සෑම පුරවැසියෙකුටම වගකීමක් තිබේ. අපගේ අයිතිවාසිකම් උල්ලංඝණය වුවහොත් ඉක්මන් පියවර ගැනීමට නීතිය පිළිබඳව දැනුවත්ව සිටීම උපකාරී වේ.

කෙසේ වෙතත්, නීතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම මගින් යම් සුවිශේෂී අභියෝග ගෙන එන බව ඔබ දැනුවත් විය යුතුය. විවිධ SOGIESC පුද්ගලයින්ට එරෙහිව අධිකරණ පද්ධතියට හෝ නීතිය ක්‍රියාත්මක කිරීමට යම් යම් පක්ෂග්‍රාහීකම් තිබිය හැක. කෙසේ වෙතත්, සියලුම මිනිසුන්ට නීතිය ඉදිරියේ සමානව සැලකීමට සහ නීතියේ සමාන ආරක්ෂාවක් ලැබීමට හිමිකම් ඇති බව ඔබ දැනුවත් විය යුතුය. අයිතිවාසිකම් සහ සහන යාන්ත්‍රණ පිළිබඳ ඔබේ දැනුම සහ ඔබේ ජාලවල ශක්තිය වැනි සාධක ඔබේ ප්‍රතිඵල කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි.

## ඇමුණුම

1. මර්වින් යනු සංක්‍රාන්තික සමාජභාවී මානව හිමිකම් ක්‍රියාධරයෙකි. ඔහු තම පෙම්වතිය වන රොෂ්නි සමඟ ජීවත් වන්නේ පිලියන්දල ප්‍රදේශයේය. සමරිසි හීතිකාවට, ද්විරිසි හීතිකාවට හා සංක්‍රාන්ති හීතිකාවට එරෙහි ජාත්‍යන්තර දිනය වෙනුවෙන් පැවැත්වූ මාධ්‍ය හමුවකදී මර්වින්, නැගී එන තරුණ දේශපාලන කණ්ඩායමක් වන "One Country Movement" විවේචනය කලේ ඔවුන්ගේ අදහස් සංක්‍රාන්ති හීතික වන බැවිනි. එම කණ්ඩායමේ නියමුවා වන මාලන්, මර්වින්ගේ විශ්ව විද්‍යාලයේම සහෝදරයෙක් වූ අතර දිනක් මර්වින්ගේ නිවසට පැමිණ ඇති බැවින් මාලන්, මර්වින් ජීවත් වන ස්ථානය පිලිබඳ දැනුවත්ය. මර්වින්ගේ මෙම මාධ්‍ය සාකච්ඡාවෙන් කෝපයට පත් මාලන්, පසුදා මැරයන් පිරිසක් මර්වින්ගේ නිවසට යොමු කරවන අතර, එහිදී එම මැරයන් විසින් රොෂිනීට පහර දී ලිංගික අතවර සිදු කර ඇත. එමෙන්ම මර්වින්ගේ පරිඝනකයේ මුරපදයද (password) බලහත්කාරයෙන් ලබා ගෙන එය රැගෙන යාමට උත්සාහ කර ඇත.

2. සරත් යනු තනිව ජීවත් වන සමරිසි පිරිමි පුද්ගලයෙකු වන අතර ඔහුට වයස අවුරුදු 70කි. දිනක් අමල් හා කමල් යන තරුණයන් දෙදෙනෙකු ඔහුගේ නිවස බිඳ වටිනා ඔරලෝසුවක් සොරාගෙන ඇත. පසුව මේ සම්බන්ධයෙන් සරත් පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කරන අතර, පසුවදාම පොලිසිය විසින් මෙසේ නිවස බිඳ දැමූ පුද්ගලයින් දෙදෙනා පොලිස් ස්ථානයට කැඳවනු ලබයි. කමල්ගේ වැඩිමල් සහෝදරයා පොලිස් ස්ථානාධිපතිවරයාගේ මිතුරෙකු වන අතර, ඔහු ස්ථානාධිපතිවරයා අමතා තම සහෝදරයා ගැටලුවකට මුහුණ පා ඇති බවත් එය විසඳා දෙන ලෙසත් පවසා ඇත. පසුව මොවුන් දෙදෙනා පොලිස් ස්ථානයේදී පවසන්නේ සරත් ඔවුන්ට නිවසට ආරාධනා කල බවත් එසේ සිදු කර ලිංගික අතවර සිදු කල බවත්ය. එහිදී ඔවුන් දෙදෙනා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර නැවත පැමිණියා මිසක නිවසින් කිසිදු දෙයක් ලබා නොගත් බවට ප්‍රකාශ කර ඇත. පොලීසිය මෙම පුද්ගලයින් ප්‍රකාශ කරනා දෙය සත්‍යයක් බවට පිළිගන්නා අතර, සරත්ගේ පැමිණිල්ල සටහන් කර ගැනීම ඔවුන් ප්‍රතික්ෂේප කලහ.

3. සවනි කොළඹ පිහිටි අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවය කරයි. ඇය සමරිසි, වයස අවුරුදු 40ක පුද්ගලයෙක් වන අතර ඇය තම දෙමව්පියන් සමඟ ජීවත් වේ. කෙතරම් වෙහෙස වී රැකියාව කල ද ඇයට උසස්වීම් ලැබුනේ නැත. මීළඟ උසස්වීම තමාට වුවත්, ඒ සම්බන්ධයෙන් ඇයව නොසලකා හරින බව ඇය සොයා ගනී. ඇය තම සුපරීක්ෂක වන මාලිනී ගෙන් තමාගේ උසස් කිරීම නොසලකා හරින්නේ ඇයි දැයි විමසීය. එහිදී ඇය, සවනි සමරිසි පුද්ගලයෙක් නිසාවෙන් ඇය වැනි කෙනෙකුට උසස් වීමක් ලබා දීම තුලින් දෙපාර්තමේන්තුවට අගෞරවයක් බවට පැහැදිලි කරයි.

4. ෂෝන් යනු ශ්‍රී ලංකාවේ රජයේ පාසලක 14 හැවිරිදි සිසුවෙකි. ඔහු පන්තියේ මිතුරෙකු වන රේමන් කෙරෙහි ඇල්මක් දක්වයි. දවසක් ෂෝන් රේමන්ට ආදර ලිපියක් ලියන අතර එය පාසල් ගුරුවරයාට හමු වේ. ගුරුවරයා එය විදුහල්පතිවරයාට ලබා දෙයි. විදුහල්පතිවරයා ෂෝන්ගේ දෙමාපියන් පාසලට කැඳවා ඔහුව පාසලෙන් ඉවත් කරන ලෙස ඉල්ලා සිටියි. ෂෝන්ගේ මව නීතීඥවරියක් වන අතර ඇය ෂෝන්ව පාසලෙන් පිටතට ගෙන යාමට කැමති නැත. ඇත්ත වශයෙන්ම, මෙය FR උල්ලංඝනය කිරීමක් යැයි ඇය සිතන අතර පියවර ගැනීමට යයි.

5. ජෙනෙල් තරුණ සංක්‍රාන්තික සමාජභාවී කාන්තාවකි. දිනක් ඇය රැකියාවට යන අතරතුර සාමාන්‍ය පොලිස් මුරපොලකදී ඇයගේ වාහනය පොලිස් නිලධාරින් විසින් නතර කරයි. එවිට ඇයගේ රියදුරු බලපත්‍රයේ ඇයගේ නම ජේසන් ලෙසත්, පුරුෂ ලිංග ලෙසත් සඳහන් කර ඇති බව දකින පොලිස් නිලධාරින් ඇය වෙනත් අයෙකු ලෙස පෙනී සිටිමින් වංචා කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනී. ඇයව පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය පසු නිලධාරින් දෙදෙනෙක් විසින් ඇය සමාජයට තර්ජනයක් බව ප්‍රකාශ කරමින් තර්ජනය කරන අතර, එහි සිටි තවත් නිලධාරියෙක් ඇගේ පියයුරු ස්පර්ශ කරමින් ඒවා ඇත්ත ද යන්න තහවුරු කර ගැනීමට උත්සාහ කර ඇත.

BRIDGE to Equality යනු ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාවන්ගේ මානව හිමිකම් සුරැකීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ජාත්‍යන්තර මානව හිමිකම් සහ නීති පිළිබඳව විනිසුරුවරුන්, නීතීඥයින් සහ අනෙකුත් මානව හිමිකම් ක්‍රියාකාරීන් දැනුවත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින්ගේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම, ශ්‍රී ලංකාවේ වත්මන් නීතිමය රාමුව විසින් පනවන ලද අභියෝග ජය ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම, මානව හිමිකම් කඩ වූ ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින් හට යුක්තිය ලබා ගැනීමට ඔවුනට අවශ්‍ය සහය ලබාදීමද අරමුණු කරගනී.

BRIDGE to Equality ව්‍යාපෘතිය 2021 වසරේ සිට DAST, National Transgender Network සහ Young Out Here ආයතන විසින් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිෂන් සභාව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.


facebook.com/BridgetoEquality
instagram.com/bridgetoequality2021
twitter.com/B2ECampaign
bridgetoequalitycampaign@protonmail.com